www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## *20-22 පරිච්ඡේද*

**Marxism, History & Socialist Consciousness**
**Chapters 20-22**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

*හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත* Marxism, History & Socialist Consciousness *(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. එය රචනා කරන ලද්දේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්යේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන් වන ඇලෙක්ස් ස්ටයිනර් හා ෆ්‍රෑන්ක් බෙනර් විසින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කරන ලද* Objectivism or Marxism *(වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) නම් වූ විවේචනයකට පිලිතුරු වසයෙනි.*

*අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන දෙසැම්බර් 10 දා පල වූ අතර 1. 2 හා 3 වන පරිච්ජේද දෙසැම්බර් 11 දා ද 4 සිට 7 දක්වා පරිච්ජේද දෙසැම්බර් 13 දා ද 8 සිට 10 දක්වා පරිච්ජේද දෙසැම්බර් 15 දා ද 11 සිට 13 දක්වා පරිච්ජේද දෙසැම්බර් 18 දා ද 14 සිට 16 දක්වා පරිච්ජේද දෙසැම්බර් 20 දා ද 17 සිට 19 දක්වා පරිච්ජේද දෙසැම්බර් 20 දා ද පල විය. එහි අවසාන කොටස වන 20 සිට 22 දක්වා පරිච්ජේද පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.*

## 20. සමාජවාදී විඥානය පිලිබඳ විල්හෙල්ම් රීක්ගේ සංකල්පනය

ජියොසෙගාන් ආරක්ෂා කිරීමේ දී ඔබ විල්හෙල්ම් රීක්ගේ කෘතීන් පක්ෂපාතීව සඳහන් කරන්නෙහි ය. මෙහි ලා ඔබ මුලින් කී තැනැත්තා ද දෙවනු කී තැනැත්තා ද අතර සම්බන්ධතාවය දැක්වීම ගැන මම එකඟවෙමි. නාසීන් "ජර්මන් වමට වඩා මහජන මනෝභාවයට ආමන්ත්‍රනය කිරීමේ දී බෙහෙවින් සාර්ථක වූහ" යි ඔබ කරන සඳහන සාරභූත වසයෙන් 1930 ගනන්වල දී රීක් ඉදිරිපත් කල අදහස් ම යලි ඉදිරිපත් කිරීමකි. රීක් සමග එකඟත්වය දක්වමින් ඔබ මෙසේ ද ලියන්නෙහි ය.

> "දේශපාලන විඥානය වනාහී වම්මුන් තමන්ට ව්‍යසනකාරී විපාක අත්කරගනිමින් නොතකා හරින ලද සටන් භූමියකි. සමාජවාදයට විජයග්‍රාහී විය හැකි වන්නේ මිලියන සංඛ්‍යාත කම්කරුවන්ගේ සහයෝගය දිනා ගැනීම මගින් වන අතර එය දිනාගැනීම සඳහා එම මිලියනයන්හි අපේක්ෂා, භීතිය, සහ සිහින ඇද බැඳ ගැනීමට මංපෙත් සකසා ගැනීම, වම විසින් ඉටු කල යුතුව ඇති කරුනකි."

මෙහිලා ඉස්මතු වන ප්‍රශ්නය නම් "දේශපාලන සහ සමාජවාදී" විඥානයේ වර්ධනය පිලිබඳ ගැටලුව රීක් විසින් කෙසේ වටහා ගනු ලැබී දැයි යන්න ය. ඔබේ ලියවිල්ලේ මෙම ප්‍රශ්නය පිලිබඳව ඔබට කියන්නට ඇති දේ පුදුම එලවන පරිදි ඉතා ස්වල්ප ය; ඔබ ලියාගෙන යන ගමන් "අලුත් කරන ලද සමාජවාදී පරමාර්ථ වාදයක්" වර්ධනය කල හැකි වන්නේ කෙසේ ද යන්න "1930 ගනන්වල මුලදී ජර්මන් කම්කරු පන්තික තරුනයන් සමග සෙක්ස්-පොල් ව්‍යාපාරය තුල කලා වූ ආකර්ශනීය වැඩ කටයුතු සමග රීක් භාවිතයෙන් ම" විදහා දැක් වී යයි සටහන් කර තබන්නෙහි ය. මෙම වැඩ කටයුතු සමකාලීන සමාජවාදීන් ඉතා වැදගත් පාඩම් දරා සිටින්නේ යයි අඟවනවාට පිටින් රීක්ගේ මත පිලිබඳ සාරාංශයක් ඉදිරිපත් කරන්නට හෝ ඒවායේ චිරකාලීන අදාල බව පැහැදිලි කිරීමට හෝ ඔබ අසමත් වන්නෙහි ය. කෙසේ වෙතත් බ්‍රෙනර් සහෝදරයා ඔබ 2004 දී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ස්ටීව් ලෝං සහෝදරයාට යැවූ ලියවිල්ලක, විල්හෙල්ම් රීක්ගේ තීරනාත්මක අභිනිවේශය යයි ඔබ විශ්වාස කරන්නේ කුමක් දැයි යන්න පිලිබඳ ඇඟවීමක් සම්පාදනය කලෙහි ය. හර්බට් මාකියුස් විසින් ඔහුගේ *Eros and Civilization* (කාම රාගය සහ ශිෂ්ටාචාරය) නම් කෘතියේ ඉදිරිපත් කරන ලද ආස්ථානයන්ට පක්ෂව තර්ක කරමින් ඔබ, විලිහෙල්ම් රීක් තම *The Mass Psychology of Fascism* (ෆැසිස්ට්වාදයේ මහජන මනෝ විද්‍යාව) නම් කෘතියේ ඉදිරිපත් කල මතය ම, එනම්, "මාක්ස්වාදී ව්‍යාපාරය අවරෝධිත ලුබ්ධීය ප්‍රේරකයන් ප්‍රගතිශීලී දිශාවකට යොමු කිරීමට මගක් සොයා ගත්තේ නැති නම්, එවිට ෆැසිස්ට්වාදය එම ප්‍රේරකයන්ම අපව ම්ලේච්ඡත්වයේ යුගයකට ඇද දැමීමට පාවිච්චි කරනු ඇත." යන මතය ම මාකියුස් විසින් ද සාරභූතව දරන ලදැයි පැහැදිලි කලෙහි ය. ඔබ ඉක්බිති මෙ ද එකතු කලෙහි ය. "මේ කාරනය ගැන මීට වැඩි බොහෝ දේ කීමට මට ඇත. එහෙත් මා දැන් තහවුරු කල යුත්ත තහවුරු කර ඇතැයි සිතමි."

ඇත්ත වසයෙන්ම ඔබ එය තහවුරු කලෙහි ය. " දේශපාලන" සහ "සමාජවාදී" විඥානය සඳහා අරගලය යයි ඔබ අදහස් කරන දෙය සහ මාක්ස්වාදය අතර මොන ම සම්බන්ධයක් හෝ ඇත්තේ නැත. ඔබ ලියන දෙයින් වැඩි පංගුවක් පදනම් වී ඇත්තේ විල්හෙල්ම් රීක්ගේ කෘතීන් මත ය; ඔහුගේ සංකල්ප වනාහී විප්ලවවාදී මාක්ස්වාදී සම්ප්‍රදාය ද ඓතිහාසික භෞතිකවාදය ද යන මේ දෙකට ම අති මූලිකව විරුද්ධ වූ සංකල්පයන් ය.

සත්තකින්ම, රීක් ඔහුගේ සමයේ හා සංස්කෘතියේ නිර්මානයක් වූ අතර ඔහුගේ ජීවිතයේ ඛේදවාචකයක සැබෑ අංශයක් පැවතුනි. තවත් බොහෝ දෙනා සේ හෙතෙම 1930 ගනන් හා 1940 ගනන්වල දී කම්කරු පන්තිය හා සමාජවාදී බුද්ධිමතුන් මතට කඩා පාත් වූ ව්‍යසනයේ ගොදුරක් වූයේ ය. ඔහුගේ සංකල්ප හා කෘතීන්, විශේෂයෙන්ම ඔහු ඇමරිකා එක්සත් ජනපදයට පැමිනියායින් පසුව වැඩිවැඩියෙන් ග්‍රසනිමය, අවමංගත හා දේශපාලන වසයෙන් දක්ෂිනාංශික පවා ස්වභාවයක් අත් කර ගත්තේ ය; එය 1930 ගනන්වල දී ෆැසිස්ට්වාදය විසින් ජර්මානු සහ යුරෝපීය කම්කරු පන්තිය මතට පමුනුවන ලද දුවැන්ත පරාජයේ මැකිය නොහැකි අඩයාලම එය දරා සිටියේ ය. තමාගේ බුද්ධිමය වර්ධනයේ මුල් විහිදී පැවති වියානාවේ සහ බර්ලිනයේ තමාට හුරුපුරුදු වාතාවරනයෙන් වෙන් කර දමනු ලැබූ, මානුෂික ලිංගිකත්වය පිලිබඳ සිය ගවේෂනයන් නිසා ඇමරිකානු අධිකාරීන්ගේ පලිගන්නා සුලු වෛරයට පාත්‍රව 1957 හැට හැවිරිදිව මියයන තෙක් ම පෙන්සිල්වේනියාවේ ලුවී බර්ග් දගගෙයි සිර දඬුවම් විඳීමට සිද්ධ වූ මෙම පිටුවහල් යුරෝපීය මානව විද්‍යාඥයා කෙරේ සානුකම්පිත නොවිය හැක්කේ කාට ද? වාසනාවකට මයිරන් ෂරාෆ් විසින් ලියන ලද *Fury on Earth* (මිහිමත බිහිසුනුව) නම් කෘතිය තුල එවන් ප්‍රවිෂ්ටයක් දැක ගත හැකිය.

එහෙත් විලිහෙල්ම් රීක් මුහුන දුන්නා වූ මානුෂික හා සංස්කෘතික ඛේදවාචකය පිලිබඳ දැක්විය හැකි කරුනාවක් රයිකියානු "ලිංගික- දේශපාලනය" සමග මාක්ස්වාදය සහ ට්‍රොට්ස්කිවාදය කලවම්කොට දැමීමට හෝ එය මගින් මාක්ස්වාදය හා ට්‍රොට්ස්කිවාදය විස්ථාපනය කිරීමට හෝ ඔබ දරනා ප්‍රයත්නයන් කරා ද පැතිරවිය නොහැකි ය. එවැන්නකට අපෙන් කිසිදු සමාවක් නොලැබෙනු ඇත. රීක්ගේ ලිංගික න්‍යායයන්ගෙන් සමාජවාදය - විශේෂයෙන්ම ඒවා මාස් සයිකොලොජි ඔෆ් ෆැසිසම් (ෆැසිස්ට්වාදයේ ජනක මනෝගතිය) යන කෘතියේ දැක්වෙන අයුරින් - සමාජවාදය උදෙසා මූලෝපායක් උකහා ගැනීමට දැරෙන ප්‍රයත්නය තුලින් පැන නැගිය හැක්කේ දේශපාලන අවමංගත වීමේ නරකම රූපයන් ය. 20 වන ශතවර්ෂයේ ඉතිහාසයෙන් පැන නගින ඉතාම බරපතල ප්‍රශ්නයන්ගෙන් එකක් පිලිබඳව - එනම්, ජර්මන් කම්කරු පන්තිය හිට්ලර් සහ නාසීන් විසින් පරාජය කරනු ලැබුවේ මන්ද යන්න පිලිබඳව - රීක් විසින් දෙනු ලබන පිලිතුර වනාහී විප්ලවවාදී පර්යාලෝකයක් සමග කිසි සේත් ම නොපෑහෙන විෂන්න (දූෂිත) (Morbid) අශුභවාදයකින් ඉහවහ ගිය ඒවා ය. ඔහු විසින් ෆැසිස්ට්වාදය මානව සන්තානයේ සහජ, සර්වත්‍රික දූගත භාවයක් තුල පිහිටුවීමට ඓතිහාසික භෞතිකවාදය තුල මොනම පදනමක් හෝ ඇත්තේ නැත. එතකුදු නොව, රීක් විසින් දෙනු ලබන පිලිතුරු සාවද්‍ය දේශපාලන ඉදිරිදර්ශනයක් සහ ක්‍රියා මාර්ගයක් කරා අපව යොමු කරනවා පමනක් නොව, ඒවා පිලිගන්නා අය විප්ලවවාදී දේශපාලනයෙන් සහ සමාජවාදයෙන් ඉවතට ගමන් කරවීමට ද තුඩු දෙනු ඇත. එවන් ගමන් මගක් වනාහි රීක්ගේ ම විකාශනය විසින් අපේක්ෂා කරනු ලැබුවක් ද වේ.

1933 දෙසැම්බර් මාසයේ දී ඩෙන්මාර්කයෙන් පලාගිය විල්හෙල්ම් රීක් අර්නස්ට් පැරල් යන ආරූඪ නාමයකින් *What Is Class Consciousness?* (පන්ති විඥානය යනු කුමක් ද?) යන පොත් පිංච ලිවී ය. මෙම සාපේක්ෂකව කෙටි කෘතිය ජර්මන් කම්කරු පන්තියේ පරාජයෙන් ඔහු එලඹී තිබුනු නිගමනයන් සංක්ෂිප්තව ඉදිරිපත් කලේ ය.

රීක් ගේ පොත් පිංචේ ඉතාමත් - අවධාන උචිත අංශය නම් ක්‍රියා මාර්ගය සහ ඉදිරි දර්ශනය පිලිබඳ ප්‍රශ්නයන්ට දෙන ලද සුලු අවධානය යි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සහ ස්ටැලින්වාදීන් විසින් සැබැවින්ම සෙවුනා ලද පිලිවෙත් ගැන තථ්‍ය වසයෙන් කිසිවක් කියා නැත; එහෙත් සැබැවින්ම කම්කරු පන්තිය අධෛර්යමත් කොට බෙදා ලමින්, නාසි ජයග්‍රහනයට මග පෙහෙලි කලේ එම පිලිවෙත් ම ය. මේ ප්‍රශ්න රීක්ට විශේෂ වැදගත් කමක් දරා සිටියේ නැත. කම්කරු පන්තියේ පරාජයට සාරාත්මක හේතුව සොයා ගත යුතුය යි. ඔහු කියා සිටියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ දීන අවස්ථාවාදය තුල හෝ කොමියුනිස්ට් පක්ෂයේ අතිවාම "තෘතීය සාමයේ" වික්‍රමාන්විතවාදය තුල හෝ නොව "සඵල මාක්සීය දේශපාලන මනෝවිද්‍යාවක් නැති කම තුල ය.... අපේ පැත්තෙන් ගත් කල්හි මෙම අඩුපාඩුව පන්ති සතුරාට අති මහත් වාසියක් වූ අතර ෆැසිස්ට්වාදයේ බලගතුම අවිවලින් එකක් බවට පත් විය. අප මහජනතාවට අධිරාජ්‍යවාදයේ ප්‍රතිසතිතතාවන් පිලිබඳ ගාම්භීර ඓතිහාසික විශ්ලේෂනයන් ද ආර්ථික තර්ක ද ඉදිරිපත් කරමින් සිටි අතර, ඔවුන්ගේ අත්‍යන්ත ඇතුලත හැඟීම් හිට්ලර්ට පක්ෂපාතීව පුබුදුවා දමනු ලබමින් පැවතිනි." (1971, ලන්ඩන් 18 පි.)

රීක් පන්ති විඥානය පිලිබඳ තම සංකල්පය ඉදිරිපත් කිරීමේ දී කම්කරු පන්තියේ බුද්ධිමය හැකියාවන් පිලිබඳව දක් වූ ආකල්පය, බලගතු පිලිකුලක මායිමේ පිහිටා ඇත්තකි. පලල් කම්කරු පන්තික ජනතාව, " ධනේශ්වර ආර්ථික පද්ධතියේ ප්‍රතිසතිතාවන් ද, සමාජවාදී සැලසුම් සම්පාදනයේ අතිමහත් ශක්‍යතා,

ද, නිෂ්පාදන ක්‍රමයේ උචිත ආකෘතියකට ඉඩ සලසනු වස් සමාජ විප්ලවයක අත්‍යවශ්‍යතාව ද ඉතිහාසයේ ප්‍රගතිශීලී හා ප්‍රතිගාමී බලවේගයන් ද වැනි ප්‍රශ්නයන් කෙරේ උනන්දුවනු ඇතැයි විශ්වාස කිරීම විසුලුවකට නොඅඩු දෙයකැයි ඔහු විශ්වාස කලේ ය. මේවා පක්ෂ නායකයන්ට අදාල වූ අතර ඔවුන්ගේ වඩාත් දියුනු වූ පන්ති විඥානයේ කොටසක් විය. එහෙත් ජනතාව අතර පැවති පන්ති විඥානය "එබඳු ඥානයට දුරස්ත ය; පුලුල්ව සැලකූ විට එම විඥානය උනන්දු වන්නේ සුලු සුලු කාරනා කෙරෙහි ය, දෛනික සුලභ ප්‍රශ්න කෙරෙහි ය." ජාත්‍යන්තර දේශපාලනය පිලිබඳ ගැටලු අවශ්‍යයෙන්ම දේශපාලන නායකයන් උත්සුක වූ ඒවා ය. එහෙත් ජනතා කම්කරු විඥානය වනාහී, " මුලුමනින්ම රුසියාව සහ ජපානය එංගලන්තය, ඇමරිකාව සහ ජර්මනිය අතර සන්ධු සරුවල් ගැන හෝ නිෂ්පාදන බලවේගවල වර්ධනය ගැන හෝ කිසි සේත් ම උනන්දු නැත. එය උත්සුකව යෙදී ගන්නේ මෙම වෛෂයික සන්තතියේ මිලියනයක් විවිධ කුඩා දෛනික ප්‍රශ්න හරහා දෛනික ජීවිතය තුල පිලිබිඹුවන වෛෂයික සන්තතීන් හි පිලිබිඹුව, ප්‍රකාශනය සහ බලපෑම් තුලම ය; එහෙයින් එය වඩාත් පටු අර්ථයකින් ආහාර, වස්ත්‍ර, පවුල් සම්බන්ධතා, ලිංගික තෘප්තිය යනාදිය ද වඩාත් පෘථුල අර්ථයකින් සිනමාව නාට්‍ය, උචිත ආකාර විනෝද ක්‍රියා සහ නැටුම් ද ලමයින් හදා වඩා ගැනීම නිවෙස් තනා ගැනීම, සහ විවේක සමයේ ප්‍රමානය ද තමන්ට ඇති නිදහස් කාලය ද, යනාදිය ගැන උනන්දු වෙයි." (එම 22 පිටුව)

එහෙයින් මාක්ස්වාදීන්ගේ තීරනාත්මක ම කර්තව්‍යය වන්නේ "සුලු, සුලභ, ප්‍රාථමික, සරල දෛනික ජීවිතය සහ සමාජය තුල තමන් අයත්වන තරාතිරමේ සකල සුවිශේෂතාවන් සහිත පලල්ම බහුජනතාවන්ගේ අපේක්ෂාවන් ද අතර සම්බන්ධය සොයා ගැනීම යි."(එම 23 පිටුව)

රීක් මෙතරම් අවධානයක් දුන්නා වූ ලිංගිකත්වය පිලිබඳ ප්‍රයුක්තීන් පසෙක තිබිය දී වුව සමාජවාදී විඥානය වර්ධනය පිලිබඳ ඔහුගේ ආකල්පය මාක්ස්වාදී ව්‍යාපාරයේ බුද්ධිමය හා සංස්කෘතික සම්ප්‍රදායයන්ට පිටස්තරවූ සමාජමය බලපෑම්වල බර පිලිබිඹු කලේ ය. රීක්ගේ දෘෂ්ටිය ප්‍රකාශනය කලේ බොහෝවිට කම්කරු ව්‍යාපාරය පිලිබඳව ආවේගවාදී වූ ද අනයිතිහාසික වූ ද තමන්ගේ ම මධ්‍යම පන්තික සහ වෘත්තික ස්ථරයේ අගතිමතීන්හි ගැලී ගියා වූද බුද්ධිමතුන් අතර බොහෝ විට දක්නට ලැබෙන දේශපාලන අවස්ථාවාදයේ සුවිශේෂ ග්‍රාම්‍ය රූපයකි. ඔවුහු කම්කරු පන්තිය ඓතිහාසිකව නැගී එන පන්තියක්, නව සහ වඩා ඉහල සමාජ සංවිධාන රූපයක නියෝජිතයා, බව වටහා ගැනීමට අසමත් වෙති. ඒ වෙනුවට ඔවුන් කම්කරු පන්තිය දකින ගන්නේ සංස්කෘතිය ගැන නොදත්, නොතකන බරපතල ආසක්තයන්ගෙන් තොර තිරිසන් මෘගයන්ගේ මට්ටමෙන් ඉතා මඳක් පමනක් ඉහලට නැග ගත් පසුගාමී හා අඥාන පුද්ගල සමූහයක් ලෙස ය. එසේ නම් කම්කරුවන්ට ඉතිහාසය, දේශපාලනය, ආර්ථිකය, සහ සංස්කෘතිය පිලිබඳව කතා කිරීමෙන් ඇති ඵලය කුමක් ද යි මෙවන් බුද්ධිමත්තු සිතති. ඒ නිසා මහා ජනයාට අපගේ අදහස් වටහා දීම සඳහා හැකි පහලම මට්ටමට බැස ගත යුතු ය. කුතුහලාත්මකව, මෙවන් ආකල්පයක් අදේශපාලනික වෘත්තීය සමිතිවාදය උත්කර්ෂනය කිරීමක් සමග අතින්'ත ගෙන සිටී.

අපට මොවුන්ගෙන් ඇසීමට සිදුවන්නේ ඉතිහාසයේ ප්‍රථම අති බලගතු සහ දේශපාලනිකව දියුනු මහා ජනතා කම්කරු පක්ෂය ජර්මනිය තුල පැන නැංගේ මන්දැයි කියා ය. මෙම ඓතිහාසික ප්‍රපංචය බුද්ධි ප්‍රබෝධය සමග සම්බන්ධ වූ සංස්කෘතියේ විශ්මයාවහ වර්ධනයට නිසැකවම බැඳී පවතී. 18 වන ශතවර්ෂයේ දෙවන භාගයේ දී කාන්ට්ගෙන් ඇරඹුනු දාර්ශනික චින්තනයේ විප්ලවය සමග බැඳී ගත් ජර්මානු මහා සමාජවාදී ව්‍යාපාරයේ ඉතිහාසය දියුනු න්‍යාය සහ බලගතු පන්ති-විඥාත කම්කරු ව්‍යාපාරයක් අතර ඓන්ද්‍රීය සම්බන්ධතාවයට දෙස් දුනි. කාන්ට්, ලෙසිං, හේගල්, ෆොයර්බාක්, ග'තේ, ස්කිලර්, ක්ලයිසිට්, මොසාට්, සහ බීතෝවන් ගේ උරුමය ප්‍රන්ස විප්ලවයේ බලපෑම සමග ප්‍රතිචාර දක්වමින් නිර්මානය කල අත්‍යසාමාන්‍ය සංස්කෘතික-බුද්ධිමය වාතාවරනය ජර්මනියේ නව කාර්මික කරනයත් සමග වේගයෙන් වර්ධනය වූ නව කම්කරු පන්තිය තුල පෘථුල සමාජවාදී විඥානයක් වර්ධනය කිරීම සඳහා අති විශේෂයෙන් වාසිදායක වූයේ ය. සත්තකින් ම ජර්මනියේ කලින් පැවතීගෙන ආ බුද්ධිමය සංස්කෘතියේ සමස්ත වර්ධනය එහි සංකේන්ද්‍රිත ප්‍රකාශනය අත් පත් කර ගත්තේ මාක්ස්ගේ ආරෝහ පරිනාහ පෞරුෂය තුල ය.

මාක්ස් රීක් සංකල්පනය කල ආකාරයට කම්කරු පන්තිය ගැන සංකල්පනය කලේ නම් මානව වර්ගයාගේ විමුක්තියේ ශීර්ෂය දර්ශනවාදය යයි ද කම්කරු පන්තිය එහි හෘදය යයි ද ලිවීමට අසමත් වනු ඇත. ජර්මන් කම්කරු පන්ති ව්‍යාපාරය ජර්මන් සම්භාව්‍ය දර්ශනවාදයේ උරුමක්කාරයා යයි එංගල්ස් ද නොකියනු ඇත. (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති 26 වෙලුම (මොස්කව් 1990) 398 පි,) එහි ගනන් නැති අධ්‍යාපන සමාගම් ද ව්‍යාපෘතීන් ද ඇතුලත් කර ගත් ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හුදෙක් කම්කරු පන්තියේ දේශපාලන පමනක් නොව දැවැන්ත සංස්කෘතික ව්‍යාපාරයක් ද වූයේ ය. එය කම්කරු පන්තියේ ඓතිහාසික ශාසනය පිලිබඳ න්‍යායිකව - පදනම් වූ වැටහීමකින් සමන්විත ශික්ෂකයන් විසින් මෙහෙය වුනු ව්‍යාපාරයක් විය. මාක්ස් සහ එංගල්ස් ජර්මන් කම්කරු පන්තිය, ඔවුන්ගේ ප්‍රයත්නයන් නොතැකුහයි විශ්වාස කලෝ නම් අප්‍රතිහතව දේශන පවත්වමින් ද ලේඛන කාර්යයෙහි යෙදෙමින් ද තම අධ්‍යාපක කර්තව්‍යය ඉදිරියට ගෙන යන්නට කෙසේ නම් සමත් වන්නාහු ද? ෆ්‍රාන්ස් මෙහ්රිං හෝ රෝසා

ලක්සම්බර්ග් රීක් ආකාරයෙන් කම්කරු පන්තිය ගැන ලියනු කෙනෙකුට කෙසේ වත් සිතා ගත නොහැකි ය.[27]

පන්ති විඥානය පිලිබඳ රීක්ගේ පිරිහුනු සංකල්පය පිලිබිඹු කලේ හුදෙක් ඔහුගේ ම සමාජ අගතීන් පමනක් නො වේ. ඔහුට ම නොවැටහුනු හේතු සහිත දේශපාලන ව්‍යසනයක් විසින් නිර්මානය කරනු ලැබූ වියරු භංගාපේක්ෂාව ද ඊට හේතු විය. දේශපාලන අවස්ථාවාදය වියරු අපේක්ෂා භංගත්වයේ අතුරු ඵලයක් ලෙස පැනනගින්නේ ඉඳහිට නො වේ. කම්කරු පන්තියට වටහා ගත නොහැකිය යි ඔහු විසින් සලකන ලද සංකීර්න දේශපාලන සහ න්‍යායික ප්‍රයුක්තීන් මගහැර ජනතා සන්තානයට පිවිසී ගැනීමේ මාධ්‍යයක් තමා ලිංගික ප්‍රශ්නයන් තුලින් සොයාගෙන ඇතැයි රීක් විශ්වාස කල බව කෙනෙකුට හැඟී යයි. විශේෂයෙන්ම තරුන ජනයා එවන් ප්‍රවිශ්ටයකට විවෘත යයි ඔහු විශ්වාස කලේ ය. "අපට සියලු ම රටවල ද මහාද්වීපවල ද තරුනයන්ට සමාජවාදී විප්ලවයක අවශ්‍යතාවය න්‍යායිකව ඔප්පු කල නොහැකි ය; අපට එය වර්ධනය කර ගත හැක්කේ තරුනයන්ගේ අවශ්‍යතා සහ පරස්පරයන් තුලින් පමනි. මෙම අවශ්‍යතා සහ පරස්පරයන්ගේ හරි මැද තරුන ජනයාගේ ලිංගික ජීවිතය පිලිබඳ යෝධ ගැටලුව පවතී." [*What Is Class Consciousness* (පන්ති විඥානය යනු කුමක් ද) 30 පිටුව)][28]

ජනතාව වෙත ප්‍රවිශ්ට වීම සඳහා "ලිංග-දේශපාලනය" කෝකටත් යතුරක් සපයා දෙන්නේය යන රීක් ගේ විශ්වාසයේ නිර්ලජ්ජිත අවස්ථාවාදය ද බෙහෙවින් බොලඳ බව ද, සමාජවාදීන් විසින් සංවෘත්ත ආකාරයකට ෆැසිස්ට් රැස්වීම්වලට මැදිහත් වී, ලිංගික ක්‍රියාකාරිත්වයේ අවසර දිය හැකි ස්වරූපයන් පිලිබඳව සාකච්ඡාවක් දක්ෂ ලෙස ඇරඹීම මගින් කැප වූ නාසීන්ගේ පවා කන් යොමා ගත හැකි වන්නේ කෙසේ ද යන්න පෙන්වා දීමට යයි කියා ඔහු ලියූ දීර්ඝ ඡේදයක විදහා දක්වා තිබේ.

> ...තර්කානුකූලව සිතන පුද්ගලයෙක් (නාසි) රැස්වීමක නැඟී සිට සදාචාරය සහ මිථ්‍යා විනීතය අතර පවත්නා වෙනස කුමක්දැයි ප්‍රශ්න කලහොත් ඕනෑ ම නාසි නිලධරයෙක් ඉතා අමාරු තත්වයකට ඇද වැටෙනු ඇත. මේ අනුව ගැහැනුන්ට තරුන පිරිමින් සමග තනි පංගලමේ යන්නට තහනම් කිරීම ව්‍යාජ-විනීතය වන අතර ජාතික සමාජවාදය ඉල්ලා සිටින සදාචාරාත්ම විශිෂ්ටත්වය නො වේ. එසේ නම් තනිපංගලමේ යාම තහනම් නැත. එහෙත් තරුන මිනිසෙක් ගැහැනියක් සිප ගනී නම්? නැතහොත් ඔහු ඇය හා ලිංගික සබඳතා පැවැත්වීමට සූදානම් වෙතොත්? මේවා සදාචාරාත්මකද? මේවා ද ජීවිතය වින්දනය කිරීමේ කොටසක් ය. නැති ද ? නාසියා මේ තතු තුල තවතවත් අවසර පුලුල් කොට නිදහස් ආලය අනුමත කිරීම දක්වා ම ඉදිරියට යතොත් - මේ ඔහුට කල නොහැකි දෙයක් නොවේ - එවිට අප මෙසේ ඇසිය යුතුය. එවැන්නක් විවාහය සහ පවුල තහවුරු කිරීමේ අරමුන සමග ගැටීමකට නොයයි ද?....

මේ පිලිවෙලට තම පරිකල්පිත දෙබස ඉදිරියට ගෙන යාමෙන් පසු, රීක් මෙසේ නිශ්චය කරයිඃ

> මෙම වර්ගයේ උපායයන් මුලුමනින් නව අදේශපාලනික රූපයකින් ඇති කරනු හැකි ප්‍රසිද්ධ විවාදය නීති විරෝධී පත්‍රිකා දහසකට වඩා නාසීන්ට කරදරකාරී විය හැකි බව පිලිගත යුතු ය. මන්ද යත්, නාසීන් නොදනුවත්ව ම අප උදෙසා ප්‍රචාරයකට වැටෙනු ඇති නිසා ය. පන්ති විඥානය කියා දෙයක් ඇත්තේ නැත. එය දිනපතා ජීවිතයේ සෑම අස්සක් මුල්ලක් නෑරම පැතිර පවතී! ඔබට එය වර්ධනය කල නොහැකි ය; එය කරන්නට ගියොත් ඔබ හිරේ වැටෙනු ඇත? සෑම නාසියෙකුට ම සමීපව වැදගත්වන්නා වූද දකුන කවර කලෙකවත් පිලිතුරු දීමට අසමත් වන්නා වූද එය ප්‍රශ්න හරඹ කරන්න, එවිට ඔබට පන්ති විඥානය පිලිබඳ ප්‍රශ්නය ගැන කරදර නොවී සිටිය හැකි ය. නීති විරෝධී සමයක පෙරටු-බලඇනියේ ක්‍රියා කලාපය පිලිබඳව එම ප්‍රශ්නය ගැන අපි උත්සුක නොවෙමු. අප උත්සුක වන්නේ කම්කරු පන්ති ප්‍රජාතන්ත්‍රවාදයේ සංයුක්ත සාරය පිලිබඳව ය; මිනිසුන් දහයකින් 9ක් උනන්දු නොවන කම්කරු පන්ති ප්‍රජාතන්ත්‍රවාදයේ සටන්පාඨය පිලිබඳව නො වේ." (එම 35 පිට)

විප්ලවවාදී දේශපාලනයට සාර්ථක විය හැක්කේ එය

"අන්තර්ගතයෙන් ද ආකෘතියෙන් ද... පලල් පොදු ජනයාගේ අසංකීර්න හැඟීම් ප්‍රකාශයට පත් කිරීමට උගෙන ගත් කල්හි යැ"යි ඒත්තු ගෙන සිටි රීක්, දේශපාලන ප්‍රවනතාවන් එකිනෙකින් වෙන් කල ප්‍රයුක්තීන් පිලිබඳ පැහැදිලි කර ගැනීම කෙරේ ට්‍රොට්ස්කිවාදීන් කල අවධාරනය හුදු ශක්තිය අපතේ යැවීමකැයි ස්වාභාවිකව ම නිගමනය කලේ ය. හතරවන ජාත්‍යන්තරය නිර්මානය කිරීම සඳහා වූ ට්‍රොට්ස්කිගේ කැඳැවුමට කෙලින්ම විරුද්ධව තර්ක කරමින් රීක් ලීවේ, "මහජනයා, තනි තනි විප්ලවවාදී ප්‍රවනතාවන් අතර පවත්නා සියුම් වෙනස්කම් පිලිබඳව කිසිත් නො වටහා ගන්නා අතර, ඔවුන්ට ඒ පිලිබඳ උනන්දුවක් ද නැති" (එම - පි.53) බවයි.

රීක් නාසීන්ගේ ජයග්‍රහනය පිලිබඳ තම හේතු දැක්වීම ඉදිරිපත් කල *The Mass Psychology of Fascism* (ෆැසිස්ට්වාදයේ මහජන මනෝවිද්‍යාව) වනාහි ගැඹුරු ම අපේක්ෂා භංගය ප්‍රකාශයට පත් කරන කෘතියකි. එයට අනුව ෆැසිස්ට්වාදය පෘථුල ව්‍යාපාරයක් ලෙස වැඩී ඒම වනාහී දේශපාලන තත්වයන්හි නිෂ්පාදනයක් නොව මානව සන්තානයේ රෝගී තත්වයකි. රීක් කියා සිටියේ ෆැසිස්ට්වාදය සාරභූත වසයෙන් දේශපාලන ව්‍යාපාරයක් ලෙස ගත යුතු නැතැයි කියා ය. එහි දේශපාලන ව්‍යුහය හුදෙක් ගැඹුරින් මුල් බැසගත්තාවූ මානුෂික ප්‍රපංචයක බාහිර රූපය වූවා පමනි. රීක් මෙසේ ලිවී යඃ

"විවිධ පන්තිවලට, වර්ගවලට, ජාතීන්ට, ආගමික විශ්වාසයන්ට, අයත් මිනිසුන් හා ගැහැනුන් සමග මගේ අත් දැකීම් මට උගන්වා තිබෙන්නේ, ෆැසිස්ට්වාදය වනාහි සාමාන්‍ය මිනිසාගේ චරිත ස්වභාවයේ ව්‍යුහයෙහි සංවිධිත දේශපාලන ප්‍රකාශනය වූවා පමනක් ය යන්න ය; එම ව්‍යුහය වනාහි කිසියම් ජනවර්ගයන්ට හෝ ජාතීන්ට හෝ සමහර පක්ෂවලට සීමා වූවක් නොව පොදු වූ ද ජාත්‍යන්තර වූ ද එකකි. මනුෂ්‍ය චරිතයට සම්බන්ධව ගන්නා කල්හි "*ෆැසිස්ට්වාදය" වනාහි අප සමයේ අධිකාරවාදී යන්ත්‍ර ශිෂ්ටාචාරයේ ද එහි යාන්ත්‍රික හා ගුඪවාදී ජීවිත සංකල්පයේ ද අවරෝධිත මිනිසාගේ ආවේගී ආකල්පයයි.*" (*The Mass Psychology of Fascism* (ෆැසිස්ට්වාදයේ මහජන මනෝවිද්‍යාව), නිව් යෝර්ක් 1970; පි. xiii)

"මෙම ව්‍යුහය තුල ෆැසිස්ට් හැඟීම් සහ චින්තනයේ අංශයන් දරා නොසිටින්නා වූ එක් හෝ තනි පුද්ගලයෙක් ඇත්තේ නැතැ"යි රීක් ලිවී ය, "එහි පිරිසුදු රූපයෙන් ගත් කල්හි ෆැසිස්ට්වාදය වනාහි සාමාන්‍ය මානුෂික චරිතයේ *අතාර්කික* ප්‍රතිචාරයන්හි සමස්ත ඓක්‍යයයි." (එම, පි.xiv)

රීක්, "හිට්ලර් වැලැක්වීමට මාක්ස්වාදී පක්ෂ අසමත් වූයේ සාකල්‍යයෙන්ම නව දෙයක් වූ 20 වන සියවසේ ෆැසිස්ට්වාදය 19 වන සියවසට අයත් සංකල්පයන්ගෙන් වටහා ගැනීමට ඔවුන් උත්සාහ කල නිසා ය." යි තදින් කියා සිටියේ ය. (එම, පි. xxi)

"ගතවූ 200 වසර පුරා ධනේශ්වරයේ ඓතිහාසික වර්ධනයේ සන්දර්භය තුල බහා ෆැසිස්ට්වාදයේ වර්ධනය විශ්ලේෂනය කිරීමට මාක්ස්වාදය සාවද්‍ය ලෙස යත්න දැරී ය. එහෙත් ෆැසිස්ට්වාදය "*මිනිසාගේ චරිතය, මානුෂික ගුඪවාදය සහ අධිකාරය සඳහා තන්හාව යන අවුරුදු සය දහසක තරම් කාල පරිච්ඡේදයක් තුල පැතිරී පැවති* (ගති ලක්ෂන සහිත) මිනිසාගේ චරිතය පිලිබඳ මූලික ප්‍රශ්නය ඉස්මතු කලේ ය. මෙහිදී ද ග්‍රාම්‍ය මාක්ස්වාදය අලියෙකු නරි ගුලකට රිංගවීමට තැත් කලේ ය." (එම, පි.xxvi)

රීක්ගේ විශ්ලේෂනයට අනුව මිනිස්වර්ගයාගේ තත්වය මුලුමනින්ම අපේක්ෂා රහිත වූ තරම් ය.

කොතරම් කටුක වුව ද පහත සඳහන් කරුන එසේය යි අප පිලිගත යුතු වේ: සියලු ම රටවල ජාතීන්ගේ සහ වර්ගයන්ගේ යනාදියෙහි ෆැසිස්ට්වාදයේ පදනම තුල පවතින්නේ පෘථුල ජන කොට්ඨාස තුල පවත්නා වගකීම් රහිත බව ය. ෆැසිස්ට්වාදය වනාහි අවුරුදු දහස් ගනනක් තිස්සේ මිනිසාගේ විකෘතියෙහි ප්‍රතිඵලයයි.... මෙම තත්වය අවුරුදු දහස් ගනනක් ඈතට යන සමාජ වර්ධනයක් විසින් ඇතිකරන ලද්දේ ය යන්න මත එම කරුන වෙනස් වන්නේ නැත. වගකිව යුත්තේ මිනිසා ම ය, "ඓතිහාසික වර්ධනයන්" නොවේ. සමාජවාදී නිදහස් ව්‍යාපාරයේ ඇද වැටීමට හේතු වූයේ වගකීම මේ අන්දමින් ජීවමාන මිනිසාගෙන් "ඓතිහාසික වර්ධනයන්ට" මාරුකර යැවීම යි. (එම, පි. 320)

මනුෂ්‍ය වර්ගයා ෆැසිස්ට්වාදයට රූටා යාම පිලිබඳ රීක්ගේ මනෝලිංගික විශ්ලේෂනයෙහි නව්‍ය වූත්, විචිත්‍ර වූත් අංග තිබියදී ම එය පැවති එක් දෘෂ්ටියක් සමග අති මූලික එකඟතාවකට එලැඹෙයි. ඒ, කම්කරු පන්තියට, සමාජ විප්ලවයක් කිරීමට ඇති ඓන්ද්‍රිය නොහැකියාව පිලිබඳ ප්‍රතික්ෂේප කල නොහෙන සාධනයක් හිට්ලර්ගේ ජයග්‍රහනය විසින් සපයන ලදැයි යන දෘෂ්ටිය යි. ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදරවරුනි, ඔබගේ මුල් කාලීන අධ්‍යයනයන් ඔබට යන්තමින් හෝ මතක් කරනු ඇති අන්දමට කම්කරු පන්තියේ පරාජයන් ස්ටැලින්වාදී හා සමාජප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල දේශපාලන නායකයන්ගේ සාවද්‍ය හා ද්‍රෝහී පිලිවෙත්වලට පැවරූ ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය පිලිබඳ තම අතෘප්තිය ප්‍රකාශයට පත් කල විවිධ වාම කන්ඩායම් 1930 ගනන්වල සිටියා හ. ටොට්ස්කිගේ වාම මාධ්‍යමික විවේචකයන් ප්‍රතිචාර දැක්වූයේ එම විශ්ලේෂනය මුලුමනින් නොසෑහෙතැයි යනුවෙනි. ඔව් සමහර විට නායකයෝ වරද්දා ගත්තාහ, නැතහොත් තමන්ගේ අනුගාමිකයන් දැනුවත්ව ම පාවා දුන්නා හ. එහෙත් තමන්ව පාවා දීමට ජනතාව "ඉඩදී සිටියේ" මන් ද? සිදු වූ දෙයට ඔවුන් මත් වග කිව යුතු නැත් ද? තමන්ගේ නායකයන්ට විරුද්ධ වීමට ජනතාවට බැරි වුනා ද ? ජනතාව ම විවේචනාත්මක ලෙස පරීක්ෂනයට භාජන කිරීම අවශ්‍ය නැති ද? වැරදි නායකයන් අනුගමනය කර තමන්ගේ ම පරාජය වැලඳ ගැනීමට ජනතාව පෙලඹවූ, ඔවුන්ගේ සමාජමය පැවැත්මේ හෝ ඔවුන්ගේ මනසේ අවිපර්ය ගතිලක්ෂන තුල කා වැදී පැවති ඓන්ද්‍රිය ලක්ෂන හඳුනාගත යුතු නැති ද?

මහජනතාව වින්දා වූ දේශපාලන විනාශයන් පිලිබඳව මූලිකත්වය ගත් පක්ෂ කෙරේ සහන ශීලී ආකල්පයක් පිලිබිඹු කල මෙවන් ආස්ථානයන්ට පිලිතුරු සැපයීමේ දී ට්‍රොට්ස්කි කම්කරු පන්තිය සහ එහි නායකත්වය අතර සම්බන්ධතාවය පැහැදිලි කලේ ය. මිනිසුන් තමන්ටම උචිත වූ ආන්ඩුව - කම්කරුවන් තමන්ටම උචිත වූ නායකයන් - ලබතැයි යන්න සත්‍යයක් නොවේ. ආන්ඩු මෙන් ම නායකත්වයන් ද පැන නගින්නේ පන්තීන් අතර අරගල ද පන්ති ම නිර්මානය වී පවත්නා විවිධ අසමජාතීය බහුජන අංශ අතර අභ්‍යන්තර සට්ටන ද ඇතුලු සංකීර්න සන්තතියක නිෂ්පාදිතයක් හැටියට ය. කම්කරු පන්තියේ නායකත්වය නිර්මානය කිරීම වනාහි සාතිශයව ම දුෂ්කර වූ ද දිග්ගැසුනා වූ ද ඓතිහාසික සන්තතියකි. එය කම්කරු පන්තිය තුල දශක ගනන් දිග් ගැසුනා වූ අරගලවල නියුතු ප්‍රවනතාවයන් තුල පිලිබිඹුවක් ලබයි. මෙවන් සන්තතියක් තුලින් සාධිකාරී වූද, දීර්ඝ හා දුෂ්කර අරගලයක් තුලින් මහජනතාව තුල කීර්තියක් දිනා ගත්තා වූ ද නායකත්වයක් පැන නැගීම ඓතිහාසික ජයග්‍රහනයකි. කෙසේ වෙතත්, මහජනතාව අතර අධිකාරයක් දිනා ගත් නායකත්වය, කල් ගතවීමේ දී වෙනත් පන්තීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන

පීඩනයට හසුව අභ්‍යන්තර පරිහානියට පාත්‍ර වීම පිලිබඳ අන්තරාය ඉතුරුව පවතී. මෙම පරිහානියේ පරිමානය තබා, පරිහානියක් පවතින බැව් පවා මහ ජනතාවන්ට ක්ෂනිකව දෘෂ්‍යමාන නොවන්නට පුලුවන. ඔවුහු එවිට දිගට ම තම සම්ප්‍රදායයික නායකයන් මත විශ්වාසය රඳවා සිටිති. විශේෂයෙන් ම සාපේක්ෂක සමාජ නිසංසලබවේ තතු තුල එනම් නිශ්කලංක දෛනික රටාවන් විසින් අවස්ථාවාදය කරා අනුගත වීම වගා කෙරෙන කාල පරිච්ඡේදයන් තුල (නායකත්වයන් කෙරේ) දේශපාලන වසයෙන් විශ්වාසය තැබීම නුසුදුසු වූ පසුව ද එම විශ්වාසය පවත්වා ගෙන යාමේ ස්වාභාවික ප්‍රවනතාවය විශේෂයෙන් ම කැපී පෙනෙන කරුනකි. පැරනි පක්ෂයන් විසින් අනුයන ලද පිලිවෙත් ද වේගයෙන් මාරුවන දේශපාලන තත්වයන් තුල පැනනගින වෙනස්වන්නා වූ අවශ්‍යතාවන් ද අතර පරතරය නොදැනුවත්ව ම යටගැසී පවතින තත්වයක් ඇති වෙයි. මෙතෙක් නුදුටු සමාජ-ආර්ථික ප්‍රතිසතිතාවන් මහා ඓතිහාසික කම්පනයක රූපයන් ඉස්මතු වන තෙක් එය එසේ පවතී.

ට්‍රොට්ස්කි මෙම කරුන මෙසේ පැහැදිලි කලේ ය: "දැවැන්ත ම ඓතිහාසික කම්පනයෝ යුද්ධ හා විප්ලව ම වෙත්. නිශ්චිතව ම මෙම හේතුව නිසා ම යුද්ධයේ දී හා විප්ලවයේ දී බොහෝ විට කම්කරු පන්තිය විපිලිසර වූ තත්වයකට පත් වෙයි. පැරනි නායකත්වය සිය අභ්‍යන්තර දූෂිත බව හෙලිදරව් කර ඇති තත්වයන්හි දී පවා, පැරනි ප්‍රධාන පක්ෂයේ බිඳ වැටීම ප්‍රයෝජනයට ගැනීමට සමත් ශක්තිමත් විප්ලවවාදී කේඩරයන් ඊට කලින් කාල පරිච්ඡේදයෙන් පන්තියට උරුම වී නැත් නම් අලුත් නායකත්වයක් ක්ෂනිකව ම සකසා ගැනීමට පන්තියට නුපුලුවන." (*පන්තිය පක්ෂය හා නායකත්වය* , කම්කරු මාවත ප්‍රකාශන, පි. 8)

තමන්ගේ නායකත්වයන්ගේ වැරදි සහ අපරාධවල වගකීම කම්කරු පන්තිය මත පැටවීමට උත්සාහ දරන සකල වර්ගයකම දේශපාලන ක්ෂමාලාප ට්‍රොට්ස්කි විසින් හෙලා දක්නා ලදී; එවන් ක්ෂමාලාපයෝ දේශපාලන අරගලය තුල දී "පරාජයේ සංවිධායකයන් වූ ක්‍රියා මාර්ග, පක්ෂ, සහ පුද්ගලයන්" ඉටු කල දේශපාලන ක්‍රියා කලාපය පරීක්ෂා කිරීමට අසමත්වන අතර ජර්මනියේ, ස්පාඤ්ඤයේ, හෝ ඉතාලියේ ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය "විශ්ව වර්ධනයන්ගේ දම්වැලෙහි අවශ්‍ය පුරුකක් ලෙස" ඉදිරිපත් කරති. (එම, පි. 17) ජර්මන් කම්කරු පන්තියේ පරාජය පිලිබඳ රීක්ගේ අර්ථකථනය ද ට්‍රොට්ස්කි විසින් විවේචිත මාධ්‍යමික ප්‍රවනතාවයන් ද අතර එක ම සාරභූත වෙනස නම් ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය පූර්ව නියත කලා වූ "විශ්වීය වර්ධනයන්" "සමාජ විද්‍යාත්මක දේශපාලන ස්වභාවයක් නොව ලිංගික ස්වරූපයක් ලත් ඒවා ය" යි රීක් විසින් නිගමනය කරනු ලැබීම ය.

එහෙත් දැන් අපි මහජන මනෝ විද්‍යාව පිලිබඳ ප්‍රශ්නය දෙසට හැරෙමු. එය විප්ලවවාදීන්ට හුදු නොතකා හැරිය හැක්කක් නො වේ. ජර්මන් ෆැසිස්ට්වාදය පැන නැංගා වූ සමාජ මනෝගතිය පිලිබඳව රීක්ගේ කෘතීන් ගිලගැනීමට වඩා ට්‍රොට්ස්කිගේ කෘතීන් අධ්‍යයනය කිරීමෙන් අති මහත් දැනුමක් අපට ලබා ගත හැකි ය. ස්ටයිනර් - බ්‍රෙනර් සහෝදරවරුනි ඔබ *What Is National Socialism* (ජාතික සමාජවාදය යනු කුමක් ද) යන ට්‍රොට්ස්කිගේ දීප්තිමත් ලිපිය කියවාගත් අවසාන අවස්ථාව කවදා ද? මෙහි දී පශ්චාත් යුදකාලීන ජර්මනියේ සමාජ ආර්ථික සහ දේශපාලන තත්වයන් විස්තර කල ට්‍රොට්ස්කි එම කොන්දේසි තුල මධ්‍යම පන්තිවලින් මිලියන ගනන් අනුගාමිකයන් දිනා ගැනීමට හිට්ලර්ගේ ම්ලේච්ඡ ව්‍යාපාරය සමත් වූ සැටි පෙන්නුම් කලේ ය:

> පශ්චාත් යුද කාලීන ව්‍යාකුලත්වය කම්කරුවන්ට බැට දුන්නාට නොඅඩු කෘෘරබවකින් කුඩා කර්මාන්තකරුවන්, තොරොම්බල්කාරයන්, සිවිල් සේවකයන්, යනාදීන්ට ද පහර දුනි. කෘෂිකර්මයේ ආර්ථික අර්බුදය ගොවි ජනතාව විනාශ කර දමමින් තිබුනි. මධ්‍යම ස්ථරයන් දිරාපත් වීම ඔවුන් කම්කරු පන්තිකයන් බවට පරිවර්තනය කලා නො වේ; එසේ නුවූයේ යෝධ විර
>
> විරකියන් හමුදාවක් කම්කරු පන්තියෙන් ම එලියට ඇද වැටෙමින් පැවති හෙයිනි. කෘත්‍රිම සේදවලින් තනන ලද මේස් කුට්ටම් හා ටයි පටිවලින් යන්තමින් හෝ නොවසනු ලැබූ සුලුධනේශ්වර පන්තියේ දිලිඳු බව සකල නිල ඇඳහිලි මාලා බාදනය කර දැමී ය; ඒවා අතුරෙන් ප්‍රථමයෙන් ම බාදනය කරනු ලැබුවේ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුවාදයේ ධර්මය යි.
>
> පක්ෂ වැඩියාව, මැතිවරනවල ගැහෙන උන, ඇමැතිකම් තොරතෝංචියක් නොමැතිව වෙනස් වීම, යන මේ සියල්ල නිරතුරුව එක් වී බිඳෙන්නා වූ වයිවාරන්න දේශපාලන පූට්ටු මාලාවක් පැන නංවමින් යුද්ධය, පරාජය, වන්දි, උද්ධමනය, රූර් ප්‍රදේශය (ප්‍රන්සය විසින් අල්ලා ගැනීම) අර්බුදය, අගහිඟකම් හා අපේක්ෂාභංග වියරුව තුල සුලුධනේශ්වරය තමන්ව රවටා ව්‍යාකුල කොට දැමූ සකල පැරනි පක්ෂයන්ට එරෙහිව නගා සිටවී ය. කවර විටෙක වත් බංකොලොත් බවින් තොර නොවූ සුලු දේපල හිමියෝ ද, තනතුරු හෝ සේවාදායකයින් නැතිව ගිය ඔවුන්ගේ විශ්වවිද්‍යාලගත පුත්තු ද දැවැද්ද හා මනමාලයන් නැතිව ගිය ඔවුන්ගේ දුවනිවරු ද, සමාජ සාමය තහවුරු කිරීමක් ද ඒ සඳහා යකඩ හස්තයක් ද ඉල්ලා සිටියාහ.
>
> ජාතික සමාජවාදයේ ධජය පැරනි හමුදාවේ පහල හා මැද අන දෙන්නන් අතුරෙන් මෑත දී ඉහලට පැනගත්තවුන් විසින් ඔසොවන ලදි. විශිෂ්ඨ සේවා සම්මානවලින් පිදුම්ලද පටලත් හා නොලත් නිලධාරීහු මව්බිම සඳහා තමන්ගේ වීරත්වය සහ විඳි වේදනා නිරර්ථකව ගොස් ඇති බවත්, කෘතඥතාවය ලැබීම සඳහා විශේෂ අයිතියක් ලබා දී නැති බවත්, අදහා ගැනීමට අසමර්ථ වූහ. එහෙයින් විප්ලවය හා කම්කරු පන්තිය කෙරේ ඔවුන්ගේ ක්‍රෝධය උපත ලැබී ය. එ මෙන් ම බැංකුකරුවන්, කර්මාන්තකරුවන් හා ඇමතියන් ද විසින් තමන් යලි පොත් තබන්නන්, ඉංජිනේරුවන් තැපැල් ලිපිකරුවන් හා පාසැල්

ගුරුවරුන් ලෙස අල්පේච්ඡ රැකියාවන් කරා යලි දක්කනු ලැබීම පිලිබඳව හිත හදා ගැනීමට ද ඔවුන්ට හැකි වූයේ නැත. එ මගින් ඔවුන්ගේ "සමාජවාදය" උපත ලදී. ය'සර් හි වර්ධන් යටතේ තමන්ව ම ද සෙස්සන් ද අවදානමට පාත්‍ර කර ගැනීමට ද, අන දෙන භාෂාවෙන් කතා කිරීමට ද, එමගින් සටන් පෙරමුනුවලට ඇතින් සිටි සුලුධනේශ්වරය බලගතුව බියවැදීමට ද ඔවුහු උගත්තාහු ය. මෙම මිනිසුන් නායකත්වයට පත් වූයේ මේ ආකාරයට ය.

තම දේශපාලන චර්යාවේ ආරම්භයේදී හිට්ලර් තමන්ගේ ජාතියේ අන් සියල්ලන්ට ම වඩා කැපීපෙනුනේ ඔහුට සෙස්සන්ට වඩා උස් කටහඬක් ද, පහසුවෙන් කිපෙන සුලු බව ද, වඩාත්ම ආත්ම විශ්වාසී වූ බුද්ධිමය අල්පඥතාවක් ද ඔහුට තිබුනු නිසා ය. ඔහු ව්‍යාපාරයට කිසිදු කල් තබා හදාගත් (රෙඩිමේඩ්) ක්‍රියාමාර්ගයක් - අපහාසයට ලක් වූ සොල්දාදුවා තුල පවත්නා පලිගැනීමේ පිපාසය හැරෙන්නට - ගෙන ආවේ නැත. හිට්ලර් පටන් ගත්තේ වර්සායි ගිවිසුමේ කොන්දේසි, ඉහල යන ජීවන වියදම, විශිෂ්ඨ සම්මාන ලද සාමාන්‍ය සොල්දාදුවෙකුට ගරුසරු නො කිරීම, සහ මෝසෙස්ගේ ධර්මය අනු යන (යුදෙව්) බැංකුකරුවන්ගේ ද, පුවත් කලා වේදීන්ගේ ද, කුමන්ත්‍රන පිලිබඳව ද, මැසිවිලි හා චෝදනා මාලාවකිනි. රට තුල කැලැල් හා අලුත් තුවාල තිබුනු නට්ටම් වූ හා ගිලී යන මිනිස්සු ඇති තරම් සිටියෝ ය. මේ හැමෝටම තමන්ගේ මිට මොලවා මේසයට තලන්නට උවමනාවී තිබුනේ ය. අනෙක් අයට වඩා එය හොඳට කිරීමේ හැකියාවක් හිට්ලර්ට තිබුනේ ය. රෝගය සුව කරන්නේ කෙසේදැයි ඔහු නොදන සිටි බව ඇත්තකි. එහෙත් ඔහුගේ හඬ තැලුම් දයා විරහිත දෛවය කෙරේ විටෙක තර්ජනයක් ද විටෙක යාඥාවක් ද සේ රැව් දුන්නේ ය. මරනීය අසනීපයට පාත්‍රවූවන් සේ ම විනාශයට නියමිත පන්තීහු ද නිරතුරුව ම තමන්ගේ දුක්වේදනා පිලිබඳව ද අස්වැසුම් පිලිබඳව ද නිරතුරු වෙනස් කතා කීම කවර කලෙක වත් අත නොහරිති. හිට්ලර්ගේ කතා සියල්ල මෙම තාරතාවට අනුකූල විය.

ආවේගශීලී අ-රූපතාව, විනයගත චින්තනය නොමැති වීම, වෛවාරන්න බහුශ්‍රැතභාවය සමග බැඳි අඥානතාව, යනාදි මේ සකල ඍන ලක්ෂන ධන ලක්ෂන බවට මාරු විය. ඒවා (හිට්ලර්ට) ජාතික සමාජවාදයේ හිඟන කොලපත තුලට සියලු ආකාරයේ අතෘප්තිමත් බව ගොනුකර ගැනීමට ද, එය තමන්ව තල්ලු කරන දිශාවට ජනයා මෙහෙයවීමට ද හැකියාවක් ඔහුට අත් කර දුනි. තමා කලින් ගොතා ගත් සටන්පාඨවලින් අනුකූලත්වය ලැබුනු කුමන එකක් වුව මේ ගෝසාකාරයාගේ සිතේ රැඳුනේ ය. ඔහුගේ දේශපාලන සිතුවිලි දේශනා ධ්වනිචාරයේ ප්‍රතිඵල විය. සටන්පාඨ තෝරා සකස්කරනු ලැබුවේ ඒ අන්දමට ය. ක්‍රියා මාර්ගය තහවුරු කරගනු ලැබුවේ ඒ ආකාරයට ය. අමුද්‍රව්‍යවලින් "නායකයා" ඇඹීගත්තේ ඒ විධියට ය.

ජාතික සමාජවාදී දර්ශනයේ ඉමහත් දිලිඳු බව හිට්ලර්ගේ ජයග්‍රහනය සහතිකව පැහැදිලි වූවාට පසුව සියලු රුවල් දිග හැරගෙන ඔහුගේ පස්සෙන් ගමන් කිරීමෙහි පසුබට වීමට නිල විද්‍යාවන්ට හේතුවක් නොවී ය. වෘත්තීය හැඩිරලේ බහුතරයට වයිමාර් සමූහාන්ඩු සමය කැරලිවලද භීතියේ ද සමයක් විය. ඉතිහාසඥයෝ, අර්ථශාස්ත්‍රඥයෝ, ජූරි සභිකයෝ, සහ දාර්ශනිකයෝ සත්‍යය පිලිබඳව තරග වැටී සිටි නිර්නායකයන්ගෙන් කුමක් හරියාවි දැයි, එනම්, අන්තිමේදී තත්වය පාලනය කරන බලවතා වන්නේ කුමන කඳවුර ද යන්න පිලිබඳ අනුමානයෙහි අසමර්ථ වූහ. ෆැසිස්ට් ඒකාධිපතිත්වය සරසවි පීඨවල ෆෞස්ට්වරුන්ගේ සැකයන් ද හැම්ලට්ලාගේ වැනීම ද අහෝසි කරයි. පාර්ලිමේන්තු සාපේක්ෂතාවාදයේ අඩ අඳුරෙන් එලියට බැස ගනිමින්, ඥානය යලිත් වරක් පරමයන්ගේ රාජධානියට ඇතුලු වෙයි. අයින්ස්ටයින්ට තම නිවහන ජර්මනියෙන් පිටත පිහිටුවා ගැනීමට බල කෙරී ඇත. [Leon Trotsky, *The Struggle Against Fascism in Germany* (ලියොන් ට්‍රොට්ස්කි, ජර්මනියේ ෆැසිස්ට්වාදයට එරෙහි අරගලය, නිව් යෝර්ක් 1971, පි.462-67)]

මෙම ඡේද කිහිපය තුල, ට්‍රොට්ස්කි අනුපමේය දීප්තියකින්, ජර්මන් ෆැසිස්ට්වාදයේ උමතු බවේ සමාජ සහ දේශපාලන මූලයන් ද වෛෂයික ආර්ථික සන්තතීන් සහ ඒවා ජර්මන් මධ්‍යම පන්තියේ මනස තුල පිලිබිඹුවක් අත් කර ගත් භීත-විකාර ස්වභාවය ද පැහැදිලි කලේ ය. ට්‍රොට්ස්කි දේශපාලකයෙකු ද සුධීමත් ලේඛකයෙකු ද වූ බව සැබැවි. එහෙත් ඔහුගේ සුධීභාවය මාක්ස්වාදය විසින් පෝෂිත විය. ඓතිහාසික භෞතිකවාදයේ පදනම මත කොතරම් දෙයක් ජයග්‍රහනය කරගත හැකි දැයි ඔහුගෙන් විදහා දක්විනි. ඔහු සම්පාදනය කරන අභිනිවේෂය හුදෙක් සාහිත්‍යමය සහ ඓතිහාසික ආසක්තයක් දනවනවා පමනක් නොව සමාජයේ සුලුධනේශ්වර ස්තරයන්ගේ දේශපාලන අස්ථාවරභාවය පිලිබඳ ද, ඔවුන් ෆැසිස්ට්වාදී ප්‍රචාරයන්ට ගොදුරු වීම යටින් පවත්නා වෛෂයික හේතු පිලිබඳව ද විශ්ලේෂනයක් ලෙස දිගු කල් පවත්නා අදාලබවක් දරා සිටී. ට්‍රොට්ස්කි ෆැසිස්ට් ප්‍රපංචය ගූඪතා හරනයට ලක් කරයි. එමගින් ෆැසිස්ට්වාදය තේරුම්ගත හැකි දෙයක් බවට පත් කොට එයට එරෙහිව සටන් වැදී ජය ගත හැක්කේ කුමන දේශපාලන මාර්ගයකින් ද යන්න පැහැදිලි කරයි.

අපට පහත දක්වෙන දේ පවසන විල්හෙල්ම් රීක්ගේ විශ්ලේෂනය පිලිබඳව ද එසේ කිව හැකි ද?

"...තම ලිංගික ව්‍යුහය පරස්පරයන්ගෙන් පිරී ඇත්තා වූ ද, පුරුෂ ලිංගේන්ද්‍රියයන් දුබල කරනු ලැබුවා වූ ද මිනිසාට; ඔහුගේ ලිංගිකත්වය පාලනය කර ගැනීමට, සිය ලිංගික ගරුත්වය රැක ගැනීමට, පෙලඹවීම් හමුවේ නිර්භීත වීමට, ආදී වසයෙන් නිරතුරු තමන්ට සිහි කැඳැවීම් කල යුතුව ඇත. ස්වයං වින්දනයට ඇති පෙලඹීම වලක්වා ගැනීමේ අරගලය වනාහී සැම ගැටවරයෙකුට ම, සැම ලමයෙකුට ම, ව්‍යතිරේකයකින් තොරව පවත්නා අරගලයකි. ප්‍රතිගාමී මිනිසාගේ ව්‍යුහයේ සැම අංගයක්ම මෙම අරගලයේදී වර්ධනය කරනු ලැබේ. මෙම ව්‍යුහය වඩාත් ගැඹුරට

රුකුල් දී කාවද්දනු ලබන්නේ පහල මධ්‍යම පන්තිය තුල ය." [*The Mass Psychology of Fascism* (ෆැසිස්ට්වාදයේ මහජන මනෝගතිය, පි.55)]

මෙම විශ්ලේෂනයෙන් ගලා එන්නේ කුමන පර්යාලෝකයක් ද? ක්‍රියාත්මක කලයුත්තේ කුමන පිලිවෙත් ද? කුමන සංයුක්ත දේශපාලන ආරම්භකත්වයක් ද? ඔබ ස්ටීව් ලෝං සහෝදරයාට දෑනුම දුන් පරිදි ඔබ උකහා ගෙන ඇති නිගමනය නම් මාක්ස්වාදී ව්‍යාපාරය; "අවරෝධයට ලක් ව ඇති ලුබ්ධික ආවේගයන් ප්‍රගතිශීලී දිශාවකට යොමු කල යුතු බවය..."[29]

තමන්ගේ කාලය හා ශ්‍රමය එම ශාසනය සඳහා යෙදීමෙන් ඔබ දෙදෙනා වලක්වන කිසිවෙක් නැත. එහෙත් මෙම සැක කටයුතු වූ ද අවමංගත වූ ද ව්‍යාපෘතියට සහභාගිවීමට ජාත්‍යන්තර කමිටුවට කිසිදු උනන්දුවක් ඇත්තේ නැත.

## 21. ශෘංගාරය සහ මරනය

ඔබ සමහරවිට සිතනවා ඇත්තේ ඔබ කිසියම් අති නිර්භීත සහ නවමු දෙයක නිරත වී සිටිනවා ඇතැයි කියා ය; ජාත්‍යන්තර කමිටුව යුතෝපියානු ඇජෙන්ඩාවක් වැලඳගත යුතු යයි ද අප අනාගත ලෝකය පිලිබඳව සමපේක්ෂනය කරමින් වැඩි කාලයක් ගතකල යුතුයයි ද අතීතය පිලිබඳ ගනන්හිලව් පරීක්ෂා කිරීමට හා වර්තමානය පිලිබඳ විශ්ලේෂනයන්ට අඩු කාලයක් ගත කල යුතුයයි ද අප අපගේ අවධානය දේශපාලනයේ සිට ලිංගිකත්වය කරා යොමු කල යුතු යයි ද; ලෝක ආර්ථිකයේ වෛෂයික සන්තතීන්ට අප අඩු අවධානයක් දිය යුතු යයි ද වඩා අවධානය දිය යුත්තේ පුද්ගලයාගේ උත්ප්‍රාසයන් වෙත යයි ද ඉල්ලීම මගින් රැඩිකල් චින්තනයේ නව දර්ශන පථයක් ඔබ විසින් විවර කෙරෙතැයි ද ඔබ සිතනවා විය හැකි ය. සත්තකින්ම, බ්‍රෙනර් සහ ස්ටයිනර් සහෝදරවරුනි, ඔබගේ යෝජනාවල මහත් සියත් බවක් ඇත්තේ නැත. ඔය සියලුවර්ගයේ කතා මාක්ස්වාදීන් මීට පෙර, - එක්වතාවක් නොව බොහෝ වතාවක් - අසා ඇත.

1908 දී ට්‍රොට්ස්කි විසින් ලියන ලද *Eros and Death* (ශෘංගාරය සහ මරනය) නම් ලිපියක දී ඔහු රුසියාවේ ඩිකැඩන්ට් (පරිහානික) ව්‍යාපාරයේ සහකරුවෙකු වූ රුසියානු බුද්ධිමතෙකු සමග කල සාකච්ඡාවක් මතකයට නංවයි. මෙම බුද්ධිමතා මනු සතුන්ගේ ආත්මීය හැඟීම්වලට ද ලිංගික අවශ්‍යතාවන්ට ද මරනය කෙරේ පවත්නා බියට ද මාක්ස්වාදීන් විසින් ඇතිතරම් අවධානයක් නොදීම ගැන කලකිරීම පල කලේ ය. ඩිකැඩන්ට් ගුරුකුලයේ තනි ග්‍රස්නිය බවට පත්ව තිබුනු පැවැත්මේ දෙමොහොත "ශරීර දෙකක් එක් වීමේ ප්‍රීත්‍යෝන්මත්තය සහ ආත්මය ශරීරය පැහැරයාම" කෙරේ මාක්ස්වාදීන් වඩා ගරුසරුබවක් නොදැක්වූයේ මන් ද? මාක්ස්වාදීන් මෙම උත්සුකයන් කෙරේ දැක්වූ උනන්දුව හීන වීමත්, කලාතුරකින් වීමත් ගැන බුද්ධිමතා චෝදනා කලේ යඃ "හොඳටම ගත්තොත්, ඓතිහාසික භෞතිකවාදය උත්සාහ කරන්නේ ඒ හෝ මේ සමාජ මනෝගතිය (ශෘංගාරවාදය, ගුඪවාදය) සමාජයේ විවිධ බලවේග අතර සට්ටනය මගින් පැහැදිලි කිරීමට උත්සාහ දැරීම ය. එය මේ දෙය හොඳට හෝ නරකට කරනවාද යන්න ගැන මා තකන්නේ නැත. එහෙත් ඔබ විසින් මේ සැක කටයුතු අර්ථකථන ඉදිරිපත් කරනු ලබන මම, ඒ උනත් මරනයට පත් වීමට නියමිත ය; ඉතින් ඔබේ ඓතිහාසික භෞතිකවාදය මා ඉදිරියේ විවෘත කරන සකල පර්යාලෝකයම ගතහොත්, මා මගේ අධ්‍යාත්මික ජීවිතය සඳහා ඒවා ගැන විශ්වාස කලත්, තවමත් මම එය තබනු ඇත්තේ මගේ ම අනිවාර්ය මරනය පිලිබඳ ඉදිරිදර්ශනය තුල ය. මාක්ස්වාදයට මෙම අස්තිත්වවාදී ගැටලුවලට තෘප්තිකර පිලිතුරක් නැතැයි බුද්ධිමතා විරුද්ධත්වය දැක්විය. "ඔබ මට දෙන්නේ කුමක් ද? "යි ඔහු ට්‍රොට්ස්කිගෙන් පිලිවිසී ය. "වෛෂයික විශ්ලේෂනයක්? ආවශ්‍යකත්වය පිලිබඳ තර්ක? අන්තරස්ථ වර්ධනය? නිෂේධනයාගේ නිෂේධනය? එහෙත් මේ සියල්ල භයංකර ලෙස ම නොසැහෙයි, ඒ මගේ බුද්ධියට නොව මගේ අධ්‍යාසයට ය." (ලියොන් ට්‍රොට්ස්කිගේ චින්තනය තුල සංස්කෘතිය සහ විප්ලවය, ලන්ඩන් 1999, පි.54-55 )

පරිහානිකයන්ට ද ඔවුන්ගේ "මාංශයේ අරාජකත්වයට" ද පහර දෙමින් කරන ලද දේශනයක් ඒ ලඟදීම කර තිබුනු ට්‍රොට්ස්කි තම පිලිතුර මෙසේ ආරම්භ කලේ ය. "ඔබ විසින් තෝරා ගනු ලැබ ඇති භූමියේ සටන් කිරීමට සාරභූතවම මට නොහැකි ය. කරුනාකර සලකා බලන්න, ඔබ මට කියා සිටින්නේ, බුද්ධිජීවී ස්ථරයේ සාමාජිකයෙකුට තමාගේ පෞද්ගලිකත්වයේ කට්ට ඉක්මවාගෙන මරන බිය සහ පුරාජේරු සංශයවාදය ජයගැනීමට උදව්කාරකවන ආගමික ධර්මයක්, ඔහුගේ "උපවිඥානය" හෙවත් ආත්මයේ ද ආත්මය, අප ජීවත් වන්නා වූ මහා යුගයට සම්බන්ධ කිරීමට සමත් ධර්මයක් ආවාට ගියාට සකසා දෙන ලෙස ය. එහෙත් සමාවන්න, මෙය මගේ දෘෂ්ටි ආස්ථානය විහිලුවක් බවට පත් කරනු ඇත.

එය වනාහී බයිබලයේ ඓතිහාසික උල්පත් පිලිබඳව විද්‍යාත්මක දේශනයකට ඇහුම්කන් දී සිට ඉක්බිති බයිබලයේ දැක්වෙන කල්පවිනාශයේ පදනම මත ක්‍රිස්තුගේ දෙවන ආගමන කවදා සිදුවේ ද යන්න පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටියාක් මෙනි. මහත්වරුනි "මෙය මගේ රස්සාව නම් නොවේ යයි මට ඔබට කීමට සිදුවේ. ඒක එච්චරයි." (එම, පි.57)

මා ඔබේ ලියවිල්ල කියවන විට ට්‍රොට්ස්කි පරිහානිකයන් සමග කල ඒ සාකච්ඡාව මට සිහිපත් වේ. අනාගතයේ පවුල සඳහා සැලැස්මක් ඉදිරිපත් කරන්නට ඔබ අපට කියා සිටින්නෙහි ය, අවරෝධිත ලුබ්ධිමය ප්‍රේරකයන් මුදා හැරීම උදෙසා මංපෙත් පෙහෙලි කරන ලෙස, ලිංගමය අනන්‍යතාවයේ නව රූපයන් සකසා දෙන ලෙස ද ලිංගේන්ද්‍රීය කේන්ද්‍රිත ලිංගිකත්වයේ ඒකාධිපතිත්වයට එරෙහිව ව්‍යායාමයකට

බසින ලෙස, බල කර කියන්නෙහිය. මෙයට ඉතාම උචිත පිලිතුර නම් 'මහත්වරුනි, මගේ රස්සාව නම් එය නොවේ' ය යන්නය. ඕවා ඔක්කොම සරලව ම හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාසනීය ප්‍රකාශනයේ කොටසක් නොවේ.

## 22. වෛෂයික කොන්දේසි, විද්‍යාව සහ ඉතිහාසය

ඔබ අපේ "වෛෂයික කොන්දේසි, විද්‍යාව හෝ ඉතිහාසය තුල ගැලැවීම සෙවීම" හෙලා දකින්නෙහි ය. 'ගැලැවීම' යන වචනය අපගේ දේශපාලන වාග් මාලාවේ කොටසක් නො වන බව ඔබට මතක් කිරීමට අවසර. සමාජ වැඩපිලිවෙලට ගැලැවීම ඇතුලත් නො වේ; එය සොයා යන්නවුන් සකල ආගම්වල පූජකයන් සේවනය කල යුතු ය; මෙම ක්ෂේත්‍රයේ විශේෂඥයින් නම් ඔවුන් ය. "ගැලැවීම" ගැන ඔබ කරන සඳහන උත්ප්‍රාසාත්මකව කරන ලද්දකැයි ද අපගේ " වෛෂයිකවාදයට" එරෙහි විවාදාත්මක පහරක් යයි ද ඔබ නිසැකවම තර්ක කරනු ඇත. මට එය ඉතා හොඳින් වැටැහේ. එහෙත් ඔබේ අටුවාව දේශපාලන අපේක්ෂා භංගත්වයෙන් ද නරුමත්වයෙන් ද පිරී ඉතිරී ඇතැයි යන්න ඉන් වෙනස් වන්නේ නැත. 1970 ගනන්වල මුල් කාලයේ දී ඔබව ප්‍රථමයෙන් ම වර්කර්ස් ලීගය හා ජාත්‍යන්තර කමිටුව කරා ආකර්ෂනය කර ගත්තා වූ සංකල්පයන්ට ඔය තරම්ම අතිමූලික වසයෙන් විරුද්ධ වූ ප්‍රතිමාක්ස්වාදී සංකල්පයන්ගේ බලපෑමට ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය අතහැර ගියායින් පසුව තමා හසු වූයේ කුමන ක්‍රියාවලියක් තුලින් ද යන්න ඔබ විසින් අග සිට මුලට යලිත් සලකා බැලිය යුතුව ඇත.

අප ඉතිහාසයේ ප්‍රාග් නියුක්තව සිටීම ගැන[30] දැන් ඔබ අපට අපහාස කරන්නෙහි ය. එහෙත් ඔබ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ වර්කර්ස් ලීගය සිය කටයුතු 20 වන ශතවර්ෂයේ ඛේද ජනක ඓතිහාසික අත්දැකීම් මත පදනම් කර ගත් එකම ව්‍යාපාරය වූ නිසා කලෙක එයට එකතු වූ ශිෂ්‍ය තරුනයන් පරපුරකින් කොටසක් වූවාහු ය. අපගේ දේශපාලන පිබිදීමේ යුගයේ දී දේශපාලනිකව ක්‍රියාකාරීව සිටි රැඩිකල් ප්‍රවනතාවයන් ගනනාවක් මැද්දේ වියට්නාම් යුද්ධය, ඇමරිකානු නගරවල මහජන පිපිරීම්, කම්කරු පන්ති හා අධිරාජ්‍ය විරෝධී අරගලවල පුලුල් වන්නා වූ රැල්ල, යනාදිය පිලිබඳ විශ්ලේෂනයක් පෘථුල ඓතිහාසික පර්යාලෝකයක සන්දර්භය තුල ඉදිරිපත් කිරීමට සමර්ථ වූ එකම ව්‍යාපාරය ලෙස ජාත්‍යන්තර කමිටුව ඉස්මතුව පැවැතුනි. අප ස්ටැලින්වාදයට, මාවෝවාදයට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට සහ පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහි අපගේ විරෝධය පදනම් කර ගත්තේ ඉතිහාසය පිලිබඳ පාඩම් මත මිස අන් කුමක් මත ද?

ලියොන් ට්‍රොට්ස්කිගේ ලේඛන 1970 ගනන්වල මුල් සමයේ වර්කර්ස් ලීගයට බැඳුනු අප පරපුරේ අය 1917 ඔක්තෝබර් විප්ලවය හා බෝල්ෂෙවික්වාදයේ ඉරනම සහ සමාජවාදය සඳහා ජාත්‍යන්තර අරගලය පිලිබඳ වැටැහීමකින් සන්නද්ධ කලේ ය. ට්‍රොට්ස්කි විසින් රුසියානු විප්ලවය සහ එහි ඉක්බිත්තෙන් උකහා ගනු ලැබූ සකල මූලෝපායික පාඩම්වල අපි ගිලී ගත්තෙමු. 1919 ස්පාටකස් නැගිටීමේ පරාජයෙහි පටන් 1933 ෆැසිස්ට් ජයග්‍රහනය දක්වා ජර්මන් කම්කරුවන්ගේ ව්‍යාපාරයේ දිග් ගැසුනු අර්බුදය, 1926 බ්‍රිතාන්‍ය මහා වැඩ වර්ජනය, 1925-1927 චීනයේ විප්ලවීය සිද්ධිදාමය 1923 සිට 1933 දක්වා සෝවියට් සංගමයේ වාම විපාර්ශවයේ අරගලය 1930 ගනන්වල ප්‍රන්සයේ සහ ස්පාඤ්ඤයේ මහජන පෙරමුනුවාදයේ ව්‍යසනකාරී ප්‍රතිවිපාක, සහ මොස්කව් නඩු විභාග - යන මේ සියලු යෝධ ඓතිහාසික අත්දැකීම් වර්කර්ස් ලීගයේ ද ජාත්‍යන්තර කමිටුවේ ද කාර්යධරයන් පුහුනු කිරීමට අන්තර්ගත කර ගන්නා ලදී. සියලු අශමනීය ක්‍රියාමාර්ගික වෙනස්කම් පසෙක තැබූවත්, ජාත්‍යන්තර කමිටුවේ කාර්යධරයන් අන් සියලු ව්‍යාපාරවලින් වහාම වෙන් කර තුබූ කාරනාව වූයේ ඉතිහාසය පිලිබඳව දක්වන ලද මේ පූර්ව නියුක්තිය යි; ගත වූ සමය මලේ නැතැයි ද ෆෝල්ක්නර්ගේ වචනවලින් කිව හොත් ''එය තවමත් ගත වී පවා නැතැ'' යි ද යන දෘඪ විශ්වාසය යි. ඉතිහාසය අතීතයෙන් උරුම කර ගන්නා ලද දේශපාලන සාධක ද ප්‍රතිසතිතාවන් ද ස්වරූපයෙන් ජීවත්ව පවතින්නේ යයි ද, ඒවායේ රාමුව තුල ද මහජනතාවගේ දේශපාලන සහ සමාජ විඥානයේ ස්වරූපයන් තුල ද ඉතිහාසය ජීවමානව පවතින්නේ යයි ද අපි විශ්වාස කලෙමු.

එහෙත් දැන් ඉතිහාසය සමග අපගේ නිරන්තර ප්‍රාග් නියුක්තිය ගැටලු සහගත යයි ඔබට පෙනී යන බවක් දැන් ඔබ ලියන්නෙහි ය! පශ්චාත් නූතනවාදය වනාහී අවපක්ෂයට ගොස් ඇති හුදු විලාසිතාවක් යයි ඔබ අපට කියන අතර, ඉතිහාසය නොතකන ඔබේ ආකල්පය ධනේශ්වර දර්ශනවාදයේ ප්‍රතිගාමී අඩියාලම දරා සිටී.

ඔබ විද්‍යාව කෙරෙහි දක්වන නොතකන සුලු ආකල්පය වනාහී ගත-රැඩිකල්වාදී සුලුධනේශ්වරයේ පුලුල් කොටස් අතර දක්නට ලැබෙන තර්ක-බුද්ධි විරෝධී, ප්‍රති-විද්‍යා සහ ප්‍රතිතාක්ෂන මනෝගතීන්ට යටත්වීමේ ප්‍රකාශනයක් බව අපි දකිමු. මෙම දෘෂ්ටියේ විද්‍යාත්මක මූල්‍යයන් හා ගම්‍යතා ගැන අපි දැනටම ලියා ඇත්තෙමු; දැන් එහි ප්‍රායෝගික ගුනාර්ථයන් සලකා බලන්නෙමු. ජියොසෙගාන්ගේ කෘතිය අභාවප්‍රාප්ත රුඩොල්ෆ් බාහ්රෝගේ ''යුතෝපියානුවාදයට'' කැප වූ පරිච්ඡේදයක් ඇතුලත් කර ගත් බව මේ අවස්ථාවේ දී සලකුනු කර ගැනීම වටී. බාහ්රෝ වනාහි බටහිර ජර්මනියට සංක්‍රමනය වූ නැගෙනහිර ජර්මනියේ ගත-රැඩිකල්වාදියෙකි; ඔහු (බටහිර ජර්මනියේ දී) අලුතින් තනන ලද ග්‍රීන් (හරිත) පක්ෂයේ සාමාජිකයෙක් බවට පත්විය. මාක්ස්වාදය ද

කම්කරු පන්තියේ කේන්ද්‍රීය ඓතිහාසික භූමිකාව ද යන දෙක ම විශදව ම ප්‍රතික්ෂේප කල බාහ්රෝගේ ලේඛන ජියොසෙගාන්ගේ සුහද විචාරයකට ලක් වූ බව සඳහන් කිරීමෙන් ඔබ වැලැකුනේ සමහර විට ලජ්ජාව නිසා වෙන්නට ඇත. බාහ්රෝ "වත්මන් ලෝකයේ ප්‍රචලිත ප්‍රගතිය පිලිබඳ තාක්ෂනික කාර්මික අදහස බාහ්රෝ විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බව" ඔහු පැහැදිලි කරයි. "එය වනාහි සමාජය තුල සකල ආකාර පීඩනය දිගින් දිගට ම පවත්වා ගෙන යාමට උදව් වන්නා වූ ආත්මාර්ථකාමී හා විනාශකාරී සංකල්පයක් ය" යි කියන ඔහු "මෙවන් හැසිරීම්වලින් බිඳීමක් අවශ්‍ය ය - අනාගත සමාජය මීට "වඩා සරල" ව පැවැතිය යුතු ය; නැත හොත් එය කිසි සේත් ම නො පවතිනු ඇත." [*Marxism and Utopia* (මාක්ස්වාදය සහ යුතෝපියාව, 118 පිටුව.)] යි පවසයි.

බ්‍රෙනර් සහෝදරය, මෙම අදහස් ඔබ ඔබගේ "දෙයක් දැන ගැනීම වනාහි එහි අරමුන දැනගැනීම ය" යන නමින් ඉදිරිපත් කල නව - (නැත හොත් ව්‍යාජ) යුතෝපියානු ප්‍රකාශනයේ දී පල වූ අදහස්වලට බෙහෙවින් සමාන ය. නිෂ්පාදන ඵලදායීතාවයේ ඉමහත් ප්‍රසාරනයකට ද, මානව විභවය සාක්ෂාත් කිරීමට ද ශක්‍ය කරන්නා වූ සමාජවාදී ආර්ථිකයක් තුල තාක්ෂනයේ ප්‍රගතිශීලී විභවය අවධාරනය කිරීම ගැන බීම්ස් සහෝදරයාව විවේචනය කල ඔබ පහත සඳහන් දෙය අවධාරනය කලෙහි ය. "උපයෝගිතාවාදී දෘෂ්ටියකට ප්‍රතිවිරුද්ධව සමාජවාදී දෘෂ්ටියක් නිෂ්පාදන ඵලදායිතාව මානුෂික සංවර්ධනයට යටත් කරයි; එහි තේරුම නම් ආර්ථික වර්ධනයේ උපරිමකරනයට බොහෝ විට ප්‍රතිවිරුද්ධ වූ, 'කම්මැලි වීමට පවත්නා අයිතිය' වැනි අදහස්වලට තැන දීම ය."

ඔබ එහි දී කතා කලේ සරලව ම ලාභ උපරිමකරනය සහ පාලක ප්‍රභූවේ සාමාජිකයන් අත යෝධ පෞද්ගලික ධන සම්භාරයක් ගොඩගසා ගැනීම අරමුනු කර ගත් නිෂ්පාදන බලවේගවල පෞද්ගලික අයිතිය ආධිපත්‍යය දරන්නා වූ ආර්ථික පද්ධතියක් තුල තාක්ෂනය සහ මානව නිෂ්පාදන ඵලදායිතාව අපයෝජනය නො වේ. ඔබ මෙසේ ද කියා ඇත. "නිදහස සඳහා නිමක් නැති ආර්ථික වර්ධනයක් අවශ්‍යවීමට හේතුවක් නැත.... ඇත්ත කාරනය වන්නේ, විප්ලවයකින් පසු ප්‍රථම පරම්පරාවන්ට - කෙසේ වෙතත් එහි අරමුන වනවා ඇත්තේ ගෝලීය කුස ගින්න, දිළිඳුකම, සහ රෝග අහෝසි කර දැමීම ය - අවධාරනය වනු ඇත්තේ තාක්ෂනික වෙනස ගැන නො ව, තහවුරු වී, මානව අවශ්‍යතා හොඳින්ම සපයාලිය හැක්කේ කෙසේ ද, පාරිසරිකව වඩාත් හොඳ ප්‍රතිඵල ලබා දෙන්නේ කුමක් ද යන්න මත ය."

ආර්ථික වර්ධනය මත පරම්පරා ගනනාවකට ඇති කරන ලද සීමාබන්ධනයක් ද තාක්ෂනික වෙනස්කම් බලයෙන් ඇනහිටුවීමක් ද (මන්ද යත් තාක්ෂනයේ වර්ධනය බලයෙන් ඇනහිටුවීමක් සඳහා පොලිස් රාජ්‍ය පියවරයන්ට නො අඩු පියවරයන් අවශ්‍ය කෙරෙනු ඇති හෙයිනි) යන පියවරයන්වලින් ඇති විය හැකි සාමාජික ප්‍රතිවිපාක ගනන් බැලීම මනස නොපොහොනා කටයුත්තක් වනු ඇත. මෙය වනාහි සමාජ ව්‍යසනයක් සඳහා සූත්‍රයකි, එහි තරම ඇඟැවෙන උදාහරන සමහර රටවල බලයට පත් වූ විවිධ මාවෝවාදී බලපෑම් සහිත ව්‍යාපාරවල ප්‍රතිගාමී පර්යේෂනවල භයංකර විපාක තුලින් දැක ගත හැකි ය. එවන් අදහස් හා පිලිවෙත් මාක්ස්වාදයට සතුරු ය; ට්‍රොට්ස්කි *Revolution Betrayed* (පාවාදුන් විප්ලවය) නම් කෘතියෙහි පැහැදිලි කල පරිදි මාක්ස්වාදය, "ප්‍රගතියේ අති මූලික බලදුන්න නම් තාක්ෂනයේ වර්ධනය ය යන පදනමෙන් අරඹා නිෂ්පාදන බලවේගයන්ගේ ගතිකය මත කොමියුනිස්ට්වාදී ක්‍රියා මාර්ගය ගොඩනගයි." (ඩිට්‍රොයිට් 1991. 39 පිටුව)

තාක්ෂනයේ සහ ශ්‍රම ඵලදායිතාවේ වර්ධනය යන දෙකින් මානව නිදහස වෙන් කොට ගැනීමට දරන ඔබේ ප්‍රයත්නය න්‍යාය සහ ඉතිහාසය පිලිබඳ නූගත් කමක් එලිදරව් කරයි. ඔබ නිවැරදි නම්, සමාජවාදී විප්ලවයෙන් නියෝජනය වන්නේ තාක්ෂනයේ වර්ධනය සහ නිෂ්පාදන ශ්‍රම ඵලදායිතාවය පහත හෙලීම සඳහා මානව සමාජය තමන්ගේ පවත්නා ආර්ථික සංවිධාන රූපයන් පෙරලා දැමූ ඉතිහාසයේ ප්‍රථම වතාව ය. එහෙත් ට්‍රොට්ස්කි ලියා දැක් වූ පරිදි "එහි ප්‍රාථමික මට්ටමට සිඳැ වූ කල්හි ඉතිහාසය වනාහි වැඩ කාලයේ සකසුරුවම් කිරීමක් සඳහා වූ අරගලයක් හැර අන් කිසිවක් නො වේ. හුදෙක් සූරාකෑම අහෝසි කිරීමෙන් පමනක් සමාජවාදය සාධාරනීකරනය කල නොහේ; එය ධනවාදයට වඩා ඉහල මට්ටමකින් කාලය සකසුරුවම් කිරීමට සමත් විය යුතු ය. මෙම සාධකය පිහිටුවා ගන්නේ නැතිව, සූරාකෑම ඉවත් කරලීම පමනක් ඉටු කල හොත් ඒ වනාහි, අනාගතයකින් තොර වූ නාට්‍යමය මොහොතක් පමනි." (එම 68 වන පිටුව.)

මේ වනවිට පැහැදිලිව පවත්නා අයුරු, විද්‍යාවේ ශක්‍යතාව පිලිබඳ අපගේ විශ්වාසය ගැන ඔබ කරන නරුම සැඳැහුම මුලුමනින් ම ප්‍රතිගාමී නො වී නම්, පසුගාමී පර්යාලෝකයක් පෙන්නුම් කරයි.[31]

අන්තිමේ දී අප එලඹෙන්නේ "වෛෂයික සාධක" සියලු දේශපාලන ගැටලු විසඳලීම සඳහා පදනම සපයනු ඇතැ යි යන අපගේ විශ්වාසය පිලිබඳව ඔබ කරන පිලිකුල් සහගත සැඳැහුමට ය. ඒවා අත් කර ගත හැක්කේ වෙන කොයිබින් දැයි අප ඔබෙන් අසන්න ද? ජාත්‍යන්තර කමිටුව පිලිබඳ විවේචනයක් වේ යයි ඔබ සිතන්නා වූ නමුත් ඇත්තෙන් ම ඔබ ආත්මීය විඥානවාදයට සහ තර්ක-බුද්ධි විරෝධයට ඇදවැටී සිටින ආකාරය නො සිතාම එලිදරව් කරන වාක්‍යයක ඔබ මෙසේ කියා සිටින්නෙහි ය. "සමාජවාදී විඥානය සඳහා සටන් කිරීමේ සැබෑ ගැටලු වෛෂයික කොන්දේසිවල සිතිජයෙන් ඔබ්බට තල්ලු වත් වත් ම කම්කරු පන්තිය ද ව්‍යාපාරයේ ක්‍රියාකාරකම්වලින් හා

උත්සුකයන්ගෙන් ඇත්වීම සිදුවන්නේ ය." මෙය ම ගුඪවාදය ය; මාක්ස්වාදය නො වේ. සවිඤ්ඤානක භාවය සඳහා තම අරගලය "වෛෂයික කොන්දේසිවල සිතිජයෙන් ඔබ" පවත්වාගෙන යන්නට යෝජනා කරන අය ඇත්තටම යථාර්ථයෙන් පලා යාමට මං සොයති.

අප ජීවත් වන්නේ ද සටන් කරන්නේ ද " වෛෂයික කොන්දේසිවල" ලෝකයේ ය; ඒවා අපගේ වත්මන් කරදරවල මූලාශ්‍රය වනවා පමනක් නො ව, එම ගැටලුවල අවසාන විසඳුමෙහි ද මූලාශ්‍රය වන්නේ ය. අනාගතයේ පැනනගින්නා වූ කුමක් වුව ද වත්මන පවත්නා සාධකවල නිෂ්පාදනය වන්නේ ය. මාක්ස් සහ එංගල්ස් පැහැදිලි කල පරිදි:

"...යථාර්ථය වශයෙන් ද *ප්‍රායෝගික* භෞතිකවාදියා එනම් කොමියුනිස්ට් වාදියා සඳහා, එය වනාහි පවත්නා ලෝකය විප්ලවවාදීව පරිවර්තනය කිරීමේ, එය සමග ප්‍රායෝගිකව පොරබැදීමකට එලඹීමේ සහ පවතිමින් තිබෙන දේ වෙනස් කිරීම පිලිබඳ ප්‍රශ්නයකි...."

"කොමියුනිස්ට්වාදය වනාහි අප විසින් පිහිටුවාලිය යුතු වූ *සිදුවීම් තත්වයක්* නො වේ, යථාර්ථය අනුගත වී ගත යුතු වූ *පරමාදර්ශයක්* නො වේ. අප කොමියුනිස්ට්වාදය යයි කියන්නේ වර්තමාන පවත්නා තත්වය අහෝසි කර දමන්නා වූ සැබෑ ව්‍යාපාරය යි. මෙම ව්‍යාපාරයේ සාධක පැන නගින්නේ දැන් පවත්නා සාධකයන්ගෙනි." [*Marx Engles Collected Works*, vol. 5 (මාක්ස්-එංගල්ස් සංගෘහිත කෘති. 5 වන වෙලුම. (1976 නිව්යෝක්, 38-49 පිටු. මුල් කෘතියේ අවධාරනය)]

සකල ප්‍රචන්ඩත්වයෙන් සහ අමානුෂික භාවයෙන් මුලු ලොව ම විමුක්ත කර ගැනීමට සමත් වන සමාජ විප්ලවයක් සඳහා සැබෑ විභවයක් අද අප ජීවත් වන මෙම ලෝකය තුල ම ගැබ් වී පවත්නා බව වටහා ගැනීම වනාහි අමතර ව්‍යාජ-මනෝරාජික ප්‍රති-අවපීඩක උත්තේජකයන් ඉල්ලා සිටින්නේ නැති තථ්‍ය වූ සුභ දර්ශනයකි.

ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදරවරුනි, ඔබ විසින් විවිධ ලියවිලිවල ඉදිරිපත් කර තිබෙන අදහස් දශක තුනකට තරම් ඈත දී ව්‍යාපාරය හැර ගිය පසු ඔබ දෙදෙනා මාක්ස්වාදයෙන් ඉවතට පාවී ගොස් තිබෙන ඉමහත් න්‍යායික සහ දේශපාලන දුර ප්‍රමානය වාර්තා කරයි. ඔබේ වත්මන් මග දිගේ ගමන් කල හොත් එය මග පාදනු ඇත්තේ අවුරුදු ගනනාවකට පෙර ඔබ පරිග්‍රහනය කලා වූ දේශපාලන ප්‍රත්‍යක්ෂයන්ගෙන් ශේෂව ඇති යමක් ඇතොත් ඒ සියල්ල මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීමක් කරා මග පාදා ගැනීමකට පමනි. මෙය එසේ සිදු නො වේවා යි අපි අපේක්ෂා කරමු. මෙම ලියවිල්ල පරෙස්සමින් අධ්‍යයනය කරන ලෙසත් දැන් ඔබ දරා සිටින ආස්ථානයන් යලි සලකා බලන ලෙසත් අපි ඔබ දෙදෙනාට ම කියා සිටිමු.

සහෝදරත්වයෙන්,

ඩේවිඩ් නෝර්ත්

ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය*

ඩිට්‍රොයිට්, ජූනි 28, 2006.

## සමාප්තයි

## සටහන්

27. ඩේවිඩ් වොල්ෂ් සහෝදරයා පසු ගිය ගිම්හාන පාසලේ දී ඉදිරිපත් කල ඉතා වැදගත් දේශනය (මාක්ස්වාදය, කලාව, සහ "කම්කරු පන්ති සංස්කෘතිය" පිලිබඳ සෝවියට් විවාදය, මගින් ජර්මනියේ පමනක් නො ව යුරෝපය පුරාම සමාජවාදී ව්‍යාපාරයේ සංස්කෘතික වැඩ කටයුතු පිලිබඳ ප්‍රයුක්තිය ආමන්ත්‍රනය කල බව පෙන්නා දීමට මට අවසර. අවාසනාවකට මෙන් ඔබගේ ලියවිල්ල මෙම දේශනය ගැන මොන ම සඳහනක් වත් කරන්නේ නැත.

28. ලිංගිකත්වය පිලිබඳ ප්‍රශ්නයන්ට ඔහු ප්‍රවිශ්ට වූ නිර්ව්‍යාජ භාවය කොතරම් වුවත්, ඔහු තමාගේ සමයේ අගතීන්ගෙන් ඉහල පැන ගත්තේ නැත:

"ස්වභාවික බහුලිංගික ඉතර ලිංගික ප්‍රවනතා වඩාත් පැහැදිලිව වර්ධනය වත් වත්, යොවුන් පුද්ගලයා විප්ලවවාදී අදහස්වලට වඩවඩාත් විවෘත වේ; සමලිංගික අවශ්‍යතාවය ඔහුගේ මනස් ව්‍යුහය තුල තහවුරු වත් වත් පොදු ලිංගිකතාව ගැන ඔහුගේ විඥානය වඩ වඩාත් සීමිත වන අතර වඩාත් පහසුවෙන් හෙතෙම දකුනට ඇදී යනු ඇත.'' (28 පිටුව).

29. බ්‍රෙනර් සහෝදරය ඔබේ යුතෝපියා ලියවිල්ලේ දී ඔබ අපට දැනුම් දෙන පරිදි: ඔබට තරමක් වෙනස් ක්‍රියාමාර්ගික න්‍යාය පත්‍රයක් පවතී. "ඌර්ජය සහතික කිරීමේ ශක්‍යතාවය (හෝ උචිත භාවය) පසෙක තිබියේවා, මෙහි ප්‍රානභූත ප්‍රශ්නයක් පවතී: සැබෑ මානව පැවැත්මක් ශක්‍ය කර ගැනීම සඳහා ආර්ථිකයේ අත්තනෝමතික ආධිපත්‍යය මෙන් ම ලිංගේන්ද්‍රයයන්ගේ අත්තනෝමතික ආධිපත්‍යය අවසන් කිරීම ද අත්‍යවශ්‍ය ය." මෙම ඡේදය ගැන අදහස් දැක්වීම එහි විකට භාවය අඩු කිරීමක් වනු ඇත.

30. මාක්ස් සහ එංගල්ස් මුලුමනින් ම වැරැදිව වටහා ගන්නා ඔබ තමන්ගේ ලියවිල්ල අරඹන්නේ *The Holy Family* (ශුද්ධ වූ පවුල) කෘතියේ,

"'ඉතිහාසය' කිසිවක් නො කරයි එය යෝධ ධනය දරා සිටින්නක් නො වේ..." යන සුප්‍රසිද්ධ ඡේදය උපුටා දක්වමිනි. පෙනී යන පරිදි ඔබ විශ්වාස කරන්නේ මෙම ඡේදය ජාත්‍යන්තර කමිටුව විසින් ඉතිහාසය අධ්‍යයනයට දෙන ලද අවධාරනයට එල්ල කල හැකි විවේචනයක් ලෙස ය. එහෙත් ඇත්ත වශයෙන්ම, එය එවැන්නක් නො වේ. මාක්ස්-එංගල්ස් මෙම ලිපිය තුල කරමින් සිටියේ සංකල්පයේ ම තර්කනයට අනුකූලව දුවවනු ලබන ස්වයං නිෂේධනය ලෙස වර්ධනය වන්නා වූ, සිද්ධීන් තමන් තුලින් ජනනය කර ගනිමින් ඉතිහාසය හේගල්ගේ පරම විඥානය බඳු ස්වයං-ප්‍රේරිත වියුක්ත සංකල්පයක් බවට ප්‍රතිවර්තනය කලා වූ වාම හෙගේලියානුවන්ගේ විඥානවාදී සංකල්පයන් විවේචනය කිරීම ය. මාක්ස්ට සහ එංගල්ස්ට ඉතිහාසයේ සංකල්පය මානව සමාජයේ වර්ධනය පිලිබඳ අධ්‍යයනයක් තුලින් වියුක්ත කර ගත යුතු විය. මාක්ස් සහ එංගල්ස් විසින් හෙගේලියානු විඥානවාදය පිලිබඳව කරන ලද විවේචනයේ ප්‍රතිඵලය ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පයයි.

31. සැලකිල්ලට භාජනය කරන ලද මෙම ප්‍රශ්නයේ සැලකිල්ලට භාජනය කිරීමට වටනා තවත් අංශයක් පවතී. සමාජවාදී විඥානය සඳහා සටන, අන් සියලු තැන්වලටත් වඩා ඇමරිකා එක්සත් ජනපදයේ දී සියලු වර්ගවල පසුගාමිත්වයට එරෙහිව විද්‍යාත්මක චින්තනය නිර්දය ලෙස ආරක්ෂා කිරීම ඉල්ලා සිටී. 2005 අප්‍රේල් මාසයේ දී ටෙරී ෂියාවෝ පිළිබඳ දේශනයක දී මෙම ප්‍රයුක්තිය ගැන මම සාකච්ඡා කළෙමි.

කම්කරුවෝ පන්තියක් හැටියට සංවිධානය කිරීමට දැරෙන ප්‍රයත්නයන්ගේ සාරභූත සංරචකයක් වන්නේ ඔවුන්ගේ බුද්ධිමය සහ සංස්කෘතික මට්ටම ඉහල දැමීම ය, සියලු වර්ගවල ආගමික මිථ්‍යාවන්ට හා පසුගාමිත්වයට විරුද්ධව විද්‍යාත්මක චින්තනයේ අරමුන හා ගමන්මග ආරක්ෂා කොට පෝෂනය කිරීම ය. එනම්, සමාජයේ සමාජ ආර්ථික සම්බන්ධතාවන් පමනක් නොව, මානව විඥානයේ අත්තිවාරම් හා එහි ව්‍යුහයේ අත්තිවාරම් ද පිලිබඳ මාක්ස්වාදී භෞතිකවාදී වැටහීමක් පෝෂනය කිරීම ය. අතීතයේ මෙන් ම දැනුදු සමාජවාදී ව්‍යාපාරය කම්කරු පන්තිය කෙරේ තම න්‍යායික හා අධ්‍යාපක වගකීම්වල දැවැන්ත පරිමාව තේරුම් ගත යුතු ය.

විද්‍යාව සමාජවාදී ව්‍යාපාරයට බුද්ධිමය උපකරන විශාල පරාසයක් සම්පාදනය කරමින් සිටින්නේය යන කරුනෙන් අපට ඉමහත් ධෛර්යයක් උකහා ගත හැකිවේ. ටෙරී ෂියාවෝ මතභේදයේ හරි මැද පැවති - නියුරෝ බයොලොජි (ස්නායු ජීව විද්‍යාව) පිලිබඳ විද්‍යාව අද න්‍යායික අතිශයින්ම චිත්තාකර්ශනීය නව ඉදිරි පියවරයන්හි කරලිය බවට පත්ව ඇත. භෞතික ව්‍යුහයන්ගෙන් අතිශයින්ම සංකීර්න වූ මොලයේ භෞතික ස්වභාවය පිලිබඳ සොයා බැලීමට විද්‍යාවේ ක්ෂේත්‍රයේ විශ්මයාවහ ඉදිරිපියවරයන් ගනු ලබමින් පවතී. මේවා අනෙක් අතට මාක්ස්වාදය විසින් ආරක්ෂාකර ඉදිරිපත් කරනු ලැබූ විඥානය සහ ඥානනය පිලිබඳ භෞතිකවාදී වැටහීම පොහොසත් කොට තහවුරු කරයි. පාලක ප්‍රභූව ආගමික ගුප්තවාදයේ අවසාන මුර කපොලු ස්නායු ජීව විද්‍යාව සහ ඊට සම්බන්ධ අංශවල පර්යේෂන මගින් බිඳ දමන ශ්‍රේෂ්ඨ ම විද්‍යාඥයන්ගේ වැඩ කටයුතුවලට මෙතරම් බිය වන්නේ මන්ද යන්න පුදුමයට කරුනක් නොවේ.

විද්‍යාවේ ආධාරයෙන් තොරව කම්කරු පන්තියට ඉදිරියට යා නොහැකි වේ. අනෙක් අතට විද්‍යාවේ ඉදිරි ගමන සඳහා කම්කරු පන්තියේ ඉදිරි ගමන අවශ්‍ය වේ. අද දින එක්සත් ජනපදය තුල දේශපාලන ප්‍රතිගාමිත්වයේ වැඩීම විද්‍යාත්මක පර්යේෂකයා වටලා සිටී. එහෙත්, හුදෙකලා විද්‍යාඥයෙකුට, හුදෙකලා කම්කරුවෙකුට මෙන් ම ස්ව ආරක්ෂාව සලසා ගත නොහැක. සමස්තයක් වසයෙන් අවසාන විග්‍රහයේ දී විද්‍යාවේ ප්‍රගතිය, තනි පර්යේෂකයන්ගේ ශාරීරික ආරක්ෂාවට අමතරව, රැඳී පවත්නේ කම්කරු පන්තියේ නව විප්ලවවාදී ව්‍යාපාරයක යලි පිබිදීම මත ය. අතිශයින්ම ප්‍රගාඪ ඓතිහාසික අර්ථයෙන් ගත් කල්හි, සමාජවාදී ව්‍යාපාරය තමන්ගේ ධජය යටතේ සකල ආකාර විද්‍යාත්මක සත්‍යය ගවේෂනය ද මානව සමානතාව සඳහා අරගලය ද ඒකාබද්ධ කරයි.

© www.wsws.org